2023

කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report







www.analyst.gov.lk

govanalyst@sltnet.lk

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களம்

Government Analyst's Department

දීපිකා සෙනෙවිරත්න
ආණ්ඩුවේ රස පරීක්ෂක

පටුන

පරිච්ඡේදය 01 - ආයතනික තොරතුරු

1.1 හැඳින්වීම
1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු
1.3 ප්‍රධාන කාර්යයන්
1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යූහය
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ
1.6 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති විස්තර

පරිච්ඡේදය 02 - දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය

පරිච්ඡේදය 03 – 2023/12/31 දිනට සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
3.4 මූල්‍ය ප්‍රකාශන වලට සටහන්
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය
3.7 මු.රෙ 208 අනුව ප්‍රතිපාදන පැවරීම
3.8 මූල්‍යමය නොවන වත්කම් වාර්තා කිරීම සම්බන්ධ ප්‍රගතිය
3.9 විගණකාධිපති වාර්තාව

පරිච්ඡේදය 04 - කාර්යසාධන ඉලක්ක

පරිච්ඡේදය 05 - සුහුරු සංවර්ධන ඉලක්ක

පරිච්ඡේදය 06 - මානව සම්පත් කළමනාකරණය

6.1 කාර්ය මණ්ඩල කළමනාකරණය
6.2 කාර්ය මණ්ඩල ඌණතා හා අතිරික්ත
6.3 මානව සම්පත් කළමනාකරණය

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය

ආයතනික තොරතුරු

1.1 හැඳින්වීම

වර්ෂ 1904 සැප්තැම්බර් මාසයේ ලංකා වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධිතව එක් නිලධාරියෙකු සමඟ ආරම්භ කරනු ලැබූ ආණ්ඩුවේ රස පරීක්ෂක ආයතනයේ ප්‍රථම රස පරීක්ෂකවරයා ලෙස බ්‍රිතාන්‍ය ජාතික කේ. සී බ්‍රවුනින් මහතා ඉතිහාසයට එක්වේ.

ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධිතව පැවති මෙම ආයතනය වර්ෂ 1913දී රජයේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත විය. දෙපාර්තමේන්තුවක් ලෙස විකාශනය වෙමින් පැවැති මෙම ආයතනය, වර්ෂ 1934 දී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ පැවැති ගොඩනැගිල්ලක ප්‍රතිස්ථාපනය කරන ලදී.

ආරම්භයේ සිටම විදේශීය ප්‍රධානීන් යටතේ පැවැති මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රථම ශ්‍රී ලාංකික රස පරීක්ෂකවරයා ලෙස ඩබ්.ආර් චන්මුගම් මහතා 1945 දී පත්විය. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යයන් පුළුල් කරමින් 1935දී සැක කටයුතු ලේඛණ පරීක්ෂා කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර 1940දී ප්‍රථම සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක ලෙස තම්බයියා නාගේන්ද්‍රන් මහතා පත්විය.

වර්ෂ 1960දී ආරක්ෂක අමාත්‍යාංශය යටතේත්, 1978 දී අධිකරණ අමාත්‍යාංශය යටතේත් ක්‍රියාත්මක වෙමින් පැවැති මෙහි ප්‍රථම කාන්තා රස පරීක්ෂකවරිය ලෙස 1993 දී යෝගරාණී මහේසන් මහත්මිය ඉතිහාසයට එක්විය.

විද්‍යාගාරයක් සඳහා උචිත නොවන ගොඩනැගිල්ලක ගැටළු රාශියකට මුහුණ දෙමින් වර්ෂ සියයකට අධික කාලයක් කොළඹ නිදහස් චතුරශ්‍රයේ පැරණි ගොඩනැගිල්ලක පැවැති රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, 2013 වර්ෂයේදී බත්තරමුල්ල, පැලවත්තේ ඉදි කරන ලද මහල් 06ක් සහිත නව විද්‍යාගාර හා කාර්යාල සංකීර්ණයකින් සමන්විත නව ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලදී.

නවීන අංගෝපාංග වලින් සමන්විත නව විද්‍යාගාරය ස්ථාපිත කිරීම හා සමගාමීව නව තාක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීමට හැකිවීම, අපරාධ යුක්තිය ඉටුකිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක විශ්ලේෂණ කාර්යක්ෂම ලෙස ඉටුකිරීමට මහඟු පිටිවහලක් විය.


එසේම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වීමේදී අධිකරණ විද්‍යා අංශයට අත්‍යවශ්‍යව පැවැති DNA තාක්ෂණය මෙරටෙහි ස්ථාපිත කිරීමෙහිලා ශ්‍රී ලංකා රජය හා USAID ව්‍යාපෘතිය හා එක්ව DNA විද්‍යාගාරයක් 2013 වර්ෂයේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ලෙහි ආරම්භ කරන ලදී.

කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (KOICA) මඟින් ප්‍රදානය කරන ලද ව්‍යාපෘතිය මඟින් 2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ DNA විද්‍යාගාරය වැඩි දියුණු කිරීමත්, ශ්‍රී ලංකාව තුල ප්‍රථම වරට පරිගණක අපරාධ විමර්ශණ විද්‍යාගාරයක් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමත්, දෙපාර්තමේන්තුව මඟින් අපරාධ යුක්තිය පසිඳලීම සඳහා සපයන විද්‍යාත්මක සාක්ෂි, තවදුරටත් සඵලදායී කිරීම සඳහා ලැබුණු සුවිශේෂී පියවරකි.

මේ අයුරින් ලබාගන්නා ලද විද්‍යාත්මක විශ්ලේෂණ වල ඉහල ගුණාත්මකභාවය තුළින් 2016 වර්ෂයේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාගාර සඳහා ISO 17025 අන්තර්ජාතික ප්‍රතීතකරණය ලබාගත හැකි විය. වර්ෂ 1904 දී එක් නිලධාරියෙකුගෙන් ආරම්භ කළ මෙම දෙපාර්තමේන්තුවේ මේ වන විට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් නිලධාරීන් 121ක් පමණ සේවය කරන අතර 21 වන රස පරීක්ෂකවරිය ලෙස දීපිකා සෙනෙවිරත්න මහත්මිය පත්වී ඇති අතර 7 වන සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක ලෙස ජේ. එම්. ආර් ජයසුන්දර මහතා පත්විය.

මෙම දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා හා ආහාර විද්‍යා යන ප්‍රධාන ක්ෂේත්‍ර දෙක යටතේ ක්‍රියාත්මක වන අතර නිහඬ වූත්, අභිමානවූත් සේවයක් ශ්‍රී ලංකාව තුළ සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩ නැංවීම වෙනුවෙන් ඉටුකරනු ලබයි.

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු



1.3 ප්‍රධාන කාර්යයන්

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා අංශය සහ ආහාර විද්‍යා අංශය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර එය ශ්‍රී ලංකාවේ ඇති එකම රජයේ අධිකරණ විද්‍යා විද්‍යාගාරය වේ. ගිනි අවි හා ප්‍රක්ෂිප්ත විද්‍යා, පුපුරණ ද්‍රව්‍ය හා ගිණි විමර්ශන, මත්ද්‍රව්‍ය හා මනෝවර්තක, මස්තු විද්‍යා හා DNA, ධූලක විද්‍යා, සැකකටයුතු ලේඛන, පරිගණක ඩිජිටල් අපරාධ විමර්ශන සහ විවිධ නඩු භාණ්ඩ යනුවෙන් ප්‍රධාන අංශ අටකින් අධිකරණ විද්‍යා අංශය සමන්විත වේ. ආහාර අංශය අහාර, ජලය හා මත්පැන් යනුවෙන් රසායනාගාර තුනකින් සමන්විතය.

මෙම දෙපාර්තමේන්තුව සේවාවන් සඳහා වෙන්වූ ආයතනයක් වන අතර, අධිකරණ, පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, වරාය අධිකාරිය, වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මඟින් යොමු කරනු ලබන නඩු භාණ්ඩ හා වෙනත් ආදර්ශ හා සාම්පල් විද්‍යාත්මක පරීක්ෂණයන්ට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සිදුකරනු ලබයි. මීට අමතරව විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන මඟින් ඉදිරිපත් කරනු ලබන ආහාර, මත්පැන්, කිරි හා ජලය ආශ්‍රිත ආදර්ශ වල තත්වය පරීක්ෂා කර වාර්තා ලබාදීම සිදු කරනු ලබයි. තවද අධිකරණ මඟින් ඉදිරිපත් කරනු ලබන සැක සහිත ලේඛණ පරීක්ෂා කර වාර්තා කිරීම සැක කටයුතු ලේඛණ අංශය මඟින් සිදු කරනු ලබයි.

පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම නඩු භාණ්ඩ හෝ වෙනත් ආදර්ශ, අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය, සාක්ෂි ආඥා පනත, ආහාර පනත, ජාතික පාරිසරික පනත, සුරාබදු ආඥා පනත, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත, සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, පළිබෝධනාශක පාලනය කිරීමේ පනත, ගිණිඅවි ආඥා පනත, පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත, විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ පනත, මෝටර් වාහන පනත, බුද්ධිමය දේපල පනත වැනි විවිධ අණ පනත් යටතේ පරීක්ෂණයන්ට භාජනය කර වාර්තා නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ.


තවද දිවයිනේ සිදුවන මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ, වෙඩි තැබීම් ආදී දරුණු ගණයේ අපරාධ සහ පිපිරීම්, ගිනි ගැනීම්, මාරක රිය අනතුරු සම්බන්ධ අපරාධ ස්ථාන විමර්ශණයන් සඳහා නිලධාරීන්ගේ විශේෂඥ සහාය පොලිස් දෙපාර්තමේන්තුව වෙත ලබාදේ. මීට අමතරව දේශීය හා විදේශීය ප්‍රභූන් හා රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා ආහාර පරීක්ෂාව සිදු කරනු ලබන්නේ ධූලක විද්‍යා (වස විෂ) අංශය මඟිනි.

රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද රස පරීක්ෂක වාර්තා සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් අධිකරණයේදී විශේෂඥ සාක්ෂිකරුවන් ලෙස දිවයිනේ විවිධ අධිකරණ වලදී විශේෂඥ සාක්ෂි ලබාදෙනු ලැබේ.

මෙවැනි සේවා සැපයීමට අමතරව විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ලබා ඇති විශේෂඥ නිලධාරීන් විසින් රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවලට විද්‍යාත්මක උපදේශනයන්ද ලබාදීම සිදුකරයි. විශේෂයෙන්ම ආහාර පනත යටතේ පනවනු ලබන රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විවිධ ප්‍රමිති පිරිවිතර සෑදීමේදී මෙම නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලබාදෙනු ලැබේ. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය ආයුධ හා උපකරණ, පුපුරන ද්‍රව්‍ය හා වෙනත් රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම් වලදී මෙන්ම වෙනත් ආයතනවල අධි තාක්ෂණික උපකරණ මිලදී ගැනීම් වලදී තාක්ෂණික කමිටු වලට තාක්ෂණික සහාය ලබාදීමද මෙම නිලධාරීන් විසින් සිදුකරනු ලැබේ.

තවද පොලිස් නිලධාරීන්, අපරාධ පරීක්ෂණ නිලධාරීන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුවේ ආධුනික නීතීඥයන්ට හා අධිකරණ වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා ඔවුන්ගේ අධිකරණ විද්‍යාත්මක හා ආහාර විද්‍යාත්මක දැනුම ප්‍රවර්ධනය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් විසින් දේශන, පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි.

1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යූහය



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

අධිකරණ විද්‍යා අංශය

මෙම අංශය යටතේ පහත සඳහන් විශ්ලේෂණ රසායනාගාර පවතී.

1. ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා රසායනාගාරය

ගිනිඅවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය විසින් විවිධ වර්ගයේ ගිනි අවි එනම් රයිපල, පිස්තෝල, පතරොම්, තුවක්කු, කොටන තුවක්කු සහ පතරොම් වර්ග ලභ තබා ගැනීමකදී, මෙවා අපරාධ සඳහා යොදා ගත් බවට සැක කරන අවස්ථා වලදී ඒවා පරීක්ෂා කර වාර්තා නිකුත් කරනු ලබයි. ගිනි අවි භාවිතා කොට සිදු කරනු ලබන අපරාධ පිළිබඳව අන්වීක්ෂීය සැසඳුම් පරීක්ෂණ සිදුකරමින් විද්‍යාත්මකව විමර්ශණය කිරීම මීට ඇතුළත් වේ. ඒ සඳහා අපරාධ වලදී භාවිතා කරන ලද ගිනිඅවි, ගිනි අවි වල කොටස්, විවිධ පතරොම් වර්ග, වැයවූ පතරොම් කොපු හා උණ්ඩ ආදිය පරීක්ෂා කරනු ලැබේ. තවද වෙඩි තැබීම් වලට ලක්වූ මෝටර් රථ, ගොඩනැගිලි ආදියද පරීක්ෂාවට ලක්කරන අතර කුමන ගිනි අවියක් අදාල අපරාධ සඳහා භාවිතා කළේද යන්න පිළිබඳ විශේෂඥ මතයන් ඉදිරිපත් කරනු ලැබේ.

2. පුපුරණ ද්‍රව්‍ය සහ ගිනි විමර්ශන රසායනාගාරය

මෙම අංශය මඟින් බෝම්බ පිපිරීම්, පුපුරණ ද්‍රව්‍ය හා පිපිරුම් උපක්‍රම (බෝම්බ) යමෙක් තම සන්තකයේ තබා ගැනීම් ඇතුළු පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර සිදුකරන අපරාධ වලට අදාල නඩු භාණ්ඩ විද්‍යාත්මක පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. සන්තකයේ තබා ගැනීමේදී අත් අඩංගුවට ගන්නා ලද විවිධ වර්ගයේ පිපිරුම් උපක්‍රම (දේශීය හා විදේශීයව) නිෂ්ක්‍රීය කිරීමෙන් පසු, ඒවායේ කොටස්ද මෙම නිලධාරීන් විසින් විශ්ලේෂණයට භාජනය කරනු ලබයි. එමෙන්ම දේපළ, ගොඩනැගිලි හා වාහන ආදිය ගිනිගැනීම් වලදී පොලිසියට කරනු ලබන පැමිණිලි හා රක්ෂණ වන්දි සඳහා කරනු ලබන ඉල්ලීම අනුව එම ගිනි ගැනීම් පිළිබඳව විමර්ශණය කර ගිනි ගැනීමට හේතුව සම්බන්ධයෙන් මතයන් ඉදිරිපත් කිරීමද මෙම අංශයේ නිලධාරීන්ගේ කාර්යයට අදාල වේ.

3. මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක රසායනාගාරය

පොලිසිය, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය, සුරාබදු මත්ද්‍රව්‍ය අංශය හෝ ශ්‍රී ලංකා රේගුව මඟින් අත්අඩංගුවට ගනු ලබන අන්තරාදායක ඖෂධ හා මනෝවර්තක යටතට ගැනෙන හෙරොයින්, මෝර්ෆීන්, අබිං, ගංජා සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, කොකේන්, මෙත්ඇම්ෆිටමීන් සහ එම කාණ්ඩයට අයත් මත්ද්‍රව්‍ය සහ New Psychoactive Substances (NPS) ගණයට වැටෙන මත්ද්‍රව්‍ය රසායනිකව හඳුනාගැනීම හා ඒවාහි ක්‍රියාකාරී සංඝටක වල සංශුද්ධතාව විශ්ලේෂණය කර අධිකරණය වෙත වාර්තා කිරීම මෙම අංශය මඟින් සිදුකරනු ලබයි. එමෙන්ම අවශ්‍ය අවස්ථාවලදී මත්ද්‍රව්‍ය රඳවාගත් ස්ථාන, මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලැබීයැයි සැකකරන ස්ථාන සහ මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට යොදාගත් වාහන ආදිය පරීක්ෂා කිරීමට පොලිසියට අවශ්‍ය විශේෂඥ සහාය ලබාදේ.

4. අධිකරණ මස්තු විද්‍යා සහ ඩී.එන්.ඒ රසායනාගාරය

විවිධ දරුණු අපරාධ සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් ලබා ගන්නා ජීව විද්‍යාත්මක ද්‍රව්‍යය මෙන්ම, ජීව විද්‍යාත්මක මව, පියා සහ දරුවන් යන මෙම පාර්ශව අතර සම්බන්ධතාවය තහවුරු කර ගැනීම සඳහා මිනිස් ශරීරයේ ශාරීරික ජෛව තරල හා දත් ඇතුළු ඕනෑම ජීව විද්‍යාත්මක ද්‍රව්‍යයක් අනුසාරයෙන් පරීක්ෂණ කටයුතු සිදු කර, ඩී.එන්.ඒ තාක්ෂණය ආශ්‍රයෙන් වාර්තා නිකුත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

එමෙන්ම සංකීර්ණ මිනීමැරුම් සහ අපරාධ ස්ථාන වල වූ රුධිර පැල්ලම්, කෙස්, ලේ විසිරීම් රටා ආදී ජීව විද්‍යාත්මක සාක්ෂි පරීක්ෂා කර, විශ්ලේෂණයෙන් අනතුරුව වාර්තා නිකුත් කිරීමද මෙම අංශයේ රාජකාරී වලට අයත් වේ.

5. අධිකරණ ධූලක විද්‍යා රසායනාගාරය

අධිකරණ ධූලක විද්‍යා අංශයේ සිටින විශේෂඥයන් විසින් අධිකරණ වෛද්‍ය කාර්යයන් හා අපරාධ විමර්ශණ සඳහා වස වර්ග හඳුනා ගැනීම පිණිස විශ්ලේෂණ කටයුතු රාශියක් සිදු කරනු ලැබේ. අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් හෝ අධිකරණය විසින් භාරදෙනු ලබන සැක සහිත සහ හදිසි මරණ වලට භාජනය වූ තැනැත්තන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණවලදී ලබාගත් ශරීර කොටස් හා ආදර්ශ, මත්ද්‍රව්‍ය සහ අනෙකුත් වස වර්ග වන සයනයිඩ්, පලිබෝධ නාශක වර්ග, විඛාදක අම්ල වර්ග සහ කාබන් මොනොක්සයිඩ් වැනි අහිතකර රසායනික ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා විශ්ලේෂණය කිරීම, බීමත්ව රිය පැදවීම සැක කරන අවස්ථාවලදී සහ මාරක රිය අනතුරුවලදී මත්පැන් හෝ වෙනත් ඖෂධ භාවිතා කර තිබේදැයි හඳුනා ගැනීම සඳහා පුද්ගලයින්ගේ රුධිරය සහ මූත්‍රා සාම්පල විශ්ලේෂණය කිරීම, අපරාධ ස්ථානයෙන් සොයාගත් අධිකරණ විද්‍යාත්මකව වැදගත් භෞතික සාක්ෂි (ඖෂධ පෙති, වස බෝතල, ඉතිරි වූ ආහාර ද්‍රව්‍ය ආදිය) ද මත්ද්‍රව්‍ය, විෂ වර්ග සහ අම්ල වර්ග හඳුනා ගැනීම සඳහා රසායනික විශ්ලේෂණ මෙම අංශය මඟින් සිදුකෙරේ.

6. අධිකරණ විද්‍යාත්මක සැකකටයුතු ලේඛන විද්‍යාගාරය

අධිකරණමය හා නීතිමය කටයුතු සඳහා අවශ්‍ය වන සැක සහිත ලිපි ලේඛන සහ ඒවා නිපදවීමට භාවිතා කරන ලද ද්‍රව්‍ය මෙම අංශය මඟින් පරීක්ෂාවන්ට ලක්කෙරේ.

සියළු වර්ග වල සැක කටයුතු ලේඛන, අත්අකුරු සහ අත්සන් ආදිය, මෙම අංශයේදී ඒවායේ නිර්ව්‍යාජභාවය සඳහා පරීක්ෂා කරනු ලැබේ. තවද අපරාධවලට මෙන්ම සිවිල් නඩු වලට අදාල ලේඛණවල තිබෙන වෙනස් කිරීම්, මැකීම්, විකෘති කිරීම්, එකතු කිරීම් සහ ආදේශ කිරීම් ආදිය හඳුනාගැනීම, ගමන් බලපත්‍ර, වීසා, ලිවීමේ උපකරණ, තීන්ත, කඩදාසි සහ අලවන ද්‍රව්‍ය, පිළිස්සුනු සහ විකෘති කරන ලද ලේඛන, ව්‍යාජ මුදල් නෝට්ටු, ලොතරැයිපත්, ආදායම් මුද්දර, තැපැල් මුද්දර සහ රජයේ ආදායමට සම්බන්ධ වෙනත් යම් ලේඛන පරීක්ෂා කර ඒවායේ නිර්ව්‍යාජ බව හෝ අදාල වෙනත් නිගමනයන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත ඉදිරිපත් කිරීම මෙම අංශයේ විශේෂඥ නිලධාරීන්ගේ කාර්යභාරය වේ.

7. පරිගණක හා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරය

මෑතකදී ස්ථාපිත කර ඇති ඩිජිටල් අපරාධ විශ්ලේෂණ අංශය මූලික ලෙස ඩිජිටල් දත්ත විශ්ලේෂණය, ඩිජිටල් ඡායාරූප විශ්ලේෂණය, කටහඬ හා ශබ්ද විශ්ලේෂණය හා ජීවමිතික ලක්ෂණ විශ්ලේෂණය යන මූලික අංශ 4ක් යටතේ විශ්ලේෂණ කටයුතු සිදුකරනු ලබයි.

පරිගණක, ජංගම දුරකථන, CCTV DVR යන්ත්‍ර ආදී ඩිජිටල් උපාංග තුළ අන්තර්ගත දත්ත විශ්ලේෂණය හා ඒවායේ මකා දමා ඇති දත්ත ප්‍රතිඋත්පාදනය, CCTV වීඩියෝ දත්ත විශ්ලේෂණය, ජීවමිතික ලක්ෂණ ඇසුරින් CCTV දර්ශණ වල හා ඩිජිටල් උපකරණ වල දර්ශනය වන පුද්ගලයින්ගේ මුහුණු හඳුනා ගැනීම, CCTV දර්ශන වල ඇතුළත් අපැහැදිලි වාහන ලියාපදිංචි අංක තහඩු හඳුනා ගැනීම, ඩිජිටල් ඡායාරූප හා වීඩියෝ පට වැඩි දියුණු කිරීම විශ්ලේෂණය හා වෙනස් කිරීම් වලට ලක්කර ඇතිද යන්න හඳුනා ගැනීම සහ කටහඬ විශ්ලේෂණය මගින් පටිගත කරන ලද සංවාදයන්හි මිනිස් කටහඬෙහි අනන්‍යතාවය තහවුරු කිරීම ආදී විශ්ලේෂණ මෙහිදී සිදු කරයි.

8. විවිධ නඩු භාණ්ඩ විශ්ලේෂණ විද්‍යාගාරය

විවිධ නඩු භාණ්ඩ අංශයේ සිටින අධිකරණ විද්‍යා විශේෂඥයින් විසින් අනිකුත් විෂයයන් යටතේ නිශ්චිතව වර්ගීකරණය කිරීමට නොහැකි අන්‍යාකාර වූ භෞතික සාක්ෂි පරීක්ෂාවට භාජන කරනු ලැබේ. සැක කටයුතු වාහන වල වැසි අංක සහ එන්ජින් අංක පරීක්ෂා කිරීම සහ ඒවා සත්‍යද, වංචනිකද, යන්න නිගමනය කිරීම හා බද්ධ කරන ලද වාහන හඳුනා ගැනීම එක් උදාහරණකි. තවද අපරාධ වලට සම්බන්ධ විවිධ වර්ගයේ ස්පර්ශ සාක්ෂි හා භෞතික සාක්ෂි උදාහරණ වීදුරු කැබලි, තීන්ත පතුරු, කෙදි වර්ග, පස්, ආයුධ, ආයුධ සලකුණු (ඇගිලි සලකුණු හැර), ලාංඡන ආදිය සඳහා විද්‍යාත්මක පරීක්ෂණ හා විවිධ තාක්ෂණික උපකරණ භාවිතා කරමින් කරනු ලබන පරීක්ෂණ මෙන්ම රසායනික විශ්ලේෂණ ක්‍රම මගින් හඳුනා ගැනීම සහ සංසන්දනය මෙම අංශය මගින් සිදු කරනු ලැබේ. මීට

අමතරව වාහන අනතුරු වලට අදාල වන වාහන අනතුරු වූ ස්ථාන සහ අදාල අනෙකුත් සාක්ෂි විද්‍යාත්මකව පරීක්ෂා කර එම අනතුරු ප්‍රති නිර්මාණය කර අවශ්‍ය වැදගත් සාක්ෂි සොයා ගැනීම මෙම අංශයේ විශේෂඥයින්ගේ වගකීමකි.

ආහාර විද්‍යා අංශය

1. ආහාර විශ්ලේෂණ රසායනාගාරය

1980 අංක 26 දරන ආහාර පනත යටතේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, ආහාර පරීක්ෂකවරුන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්) විසින් ඉදිරිපත් කරනු ලබන ආහාර සාම්පල, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන, විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම, ආහාර පාලන ඒකකය, අනෙකුත් රජයේ ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන එවැනි ආහාර සාම්පල විශ්ලේෂණය කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම හා රේගු දෙපාර්තමේන්තුව, පාරිභෝගික කටයුතු අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ආදී ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන සාම්පල විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම, ජාතික පාරිසරික පනත යටතේ ආණ්ඩුවේ විවිධ ආයතන සහ සංස්ථා සඳහා කර්මාන්ත අප ජලය විශ්ලේෂණය කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම අහාර පනත යටතේ බෝතල් කරන ලද ජලය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති රෙගුලාසි යටතේ පානීය ජලය සඳහා විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

2. මද්‍යසාර විශ්ලේෂණ රසායනාගාරය

අධිකරණය මඟින් විශ්ලේෂණය සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන නීති විරෝධී මත්පැන් සහ දුම්කොළ නිෂ්පාදන විශ්ලේෂණය කර සුරා බදු ආඥා පනත යටතේ අධිකරණය වෙත වාර්තා නිකුත් කිරීම සහ සුරාබදු දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරනු ලබන දේශීය සහ විදේශීය මත්පැන් සඳහා තත්ත්ව වාර්තා නිකුත් කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

ගිණුම් අංශය

දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය පරමාර්ථය වන කාර්යක්ෂම හා සාධාරණ ලෙස යුක්තිය පසිදලීමේ ක්‍රියාවලියට දායක වීම සඳහා අවශ්‍ය සම්පත් සහ යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය වන අරමුදල් රැස්කිරීම සහ ඒවා කාර්යක්ෂමව, ඵලදායී සහ ආර්ථිකමය වශයෙන් මෙහෙයවීම තුළින් මූල්‍ය කළමනාකරණය කිරීම හා ඊට සම්බන්ධ ගිණුම් කටයුතු පවත්වාගෙන යාමද, මූල්‍ය තොරතුරු අවශ්‍ය වෙනත් පාර්ශවයන් වෙත ලබාදීමද මූල්‍ය අංශයේ වගකීම වේ.

එම කටයුතු කර ගෙන යාමේදී,

- කාර්යක්ෂම හා සඵලදායක මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය උපදෙස් හා මග පෙන්වීම
- ආයතනය සතු වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීම
- රාජ්‍ය මුදල් රෙගුලාසි හා චක්‍ර ලේඛ විධි විධාන වලට අනුකූලව මූල්‍ය පරිහරණය කිරීම
- ගිණුම්කරණය හා වාර්තා කිරීම යනාදී කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

ආයතන අංශය

දෙපාර්තමේන්තුව තුළ ප්‍රශස්ත කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම, මානව සම්පත් කළමනාකරණය, පුහුණු කිරීම් සහ කාර්යක්ෂම හා සාධාරණ ලෙස යුක්තිය පසිදලීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණය මෙම අංශය මඟින් සිදුකරනු ලැබේ.

1.6 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතියේ විස්තර

ව්‍යාපෘතියේ නම	ප්‍රදානය කරන රට	ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල	ව්‍යාපෘතියේ කාලය
• ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ අධිකරණ විද්‍යා ඖෂධ විශ්ලේෂණයේ ධාරිතා ගොඩ නැගීම ශක්තිමත් කිරීම.	කොරියාව (KOICA Project)	ඇ. ඩො. මි 04	2022-2025
• JURE ව්‍යාපෘතිය - Support to Justice Sector Project	European Union (EU) Joint with UNDP	ඇ. ඩො. මි 1.4	2023 - 2025

02 පරිච්ඡේදය

කාර්ය සාධනය සහ අනාගත අභියෝග

විශ්ලේෂණ වාර්තා වල ප්‍රගතිය

වර්ෂයක් තුළ නිකුත් කරනු ලබන විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධනය මැන බැලීමේ ප්‍රධාන දර්ශකය වේ. 2022 වර්ෂයේ ලැබුණු නඩු භාණ්ඩ සංඛ්‍යාව 42,895 ක් වන අතර 2023 වර්ෂයේදී ලැබුණු නඩු භාණ්ඩ සංඛ්‍යාව 58,886 ක් දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව එය 37% දක්වා වර්ධනයකි. තවද 2023 වර්ෂය තුළ නිකුත් කළ විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව 53,253ක් වූ අතර එය 2022 වර්ෂයට සාපේක්ෂව 30%ක වැඩි වීමකි. (2022 වසරේ නිකුත් කළ විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව 40,756කි.)


සමස්තයක් ලෙස ගත් කල වැඩිම නඩු සංඛ්‍යාවක් ලැබී ඇත්තේ මත්ද්‍රව්‍ය හා මනෝවර්තක අංශයට වන අතර ඊට අනුව වැඩිම වාර්තා ප්‍රමාණයක් නිකුත් කර ඇත්තේ ද එම අංශයෙනි.


	2022	2023
ලැබුණු නඩු භාණ්ඩ සංඛ්‍යාව	20,798	28,133
වාර්තා කල නඩු භාණ්ඩ සංඛ්‍යාව	16,479	24,088


අංශය	විද්‍යාගාරය	2023.01.01 දිනට නඩු සංඛ්‍යාව	ලැබුණු නඩු සංඛ්‍යාව	වාර්තා කල නඩු සංඛ්‍යාව	2023.12.31 දිනට වාර්තා නොකල නඩු සංඛ්‍යාව
අධිකරණ විද්‍යා ක්ෂේත්‍රය	මත්ද්‍රව්‍ය හා මනෝවර්තක	5,709	28,133	24,088	9,754
	ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා	214	594	493	315
	පුපුරණ ද්‍රව්‍ය හා ගිනි ගැනීම්	177	661	713	125
	අධිකරණ ධූලක විද්‍යා (වස වර්ග)	891	2,730	2,482	1,139
	අධිකරණ මස්තු විද්‍යා	3,060	1,909	1,748	3,221
	සැක කටයුතු ලේඛණ	104	775	707	172
	ඩිජිටල් අපරාධ	953	976	772	1,157
	විවිධ අධිකරණ ද්‍රව්‍ය	225	852	723	354
එකතුව		11,333	36,630	31,726	16,237
ආහාර විද්‍යා ක්ෂේත්‍රය	මත්පැන්	596	11,284	10,427	1,453
	මධ්‍යසාර හා දුම්කොළ	82	2,756	2,746	92
	ආහාර පනත යටතේ ආහාර සාම්පල	171	7,590	7,731	30
	විවිධ ආහාර වර්ග	7	626	623	10
එකතුව		856	22,256	21,527	1,585
මුළු එකතුව		12,189	58,886	53,253	17,822


විශ්ලේෂණ කටයුතු වලට අමතරව සිදුකරනු ලැබූ කාර්යයන්

කාර්යය	සංඛ්‍යාව
අධිකරණ වලදී සාක්ෂි සැපයූ අවස්ථා	දින 389
අපරාධ ස්ථාන වලට සහභාගී වූ අවස්ථා	දින 414
ධූලක විද්‍යා අංශයේ නිලධාරීන් සහභාගී වූ විශේෂ ප්‍රහූ සහ රාජ්‍ය තාන්ත්‍රික ආහාර පරීක්ෂණ	නිලධාරී දින 04
දේශන පැවැත්වීම	දින 60
දේශීය පුහුණු	නිලධාරී දින ගණන 289
විදේශීය පුහුණු	නිලධාරී දින ගණන 331


Backlog clearance All Sections - 2023
20,000
18,000
16,000
14,000
12,000
10,000
8,000
6,000
4,000
2,000
-
4,587 3,966 12,810
5,542 3,538 14,814
6,602 4,641 16,775
3,148 3,303 16,620
5,037 3,893 17,764
4,957 4,717 18,004
5,323 4,732 18,595
5,040 5,048 18,587
4,808 4,886 18,509
5,109 5,047 18,571
4,646 5,124 18,093
4,087 4,358 17,822
January February March April May June July August September October November December
Received
Reported
Backlog


Backlog clearance CD Sections - 2023
12,000
10,000
8,000
6,000
4,000
2,000
-
2,431 1,727 6,413
2,593 1,342 7,664
3,218 1,734 9,148
1,636 1,536 9,248
2,490 1,642 10,096
2,289 1,898 10,487
2,534 1,804 11,217
2,196 2,176 11,237
2,174 2,386 11,025
2,224 2,358 10,891
2,276 2,482 10,685
2,072 3,003 9,754
January February March April May June July August September October November December
Received
Reported
Backlog


Backlog clearance All Sections - (2019 to 2023)
70,000
60,000
50,000
40,000
30,000
20,000
10,000
-
43,229 40,745 14,171
35,191 34,689 14,673
29,273 36,328 7,700
45,245 40,756 12,189
58,886 53,253 17,822
2019 2020 2021 2022 2023
Received
Reported
Backlog



1. විශ්ලේෂණය අවසන් කර ගත නොහැකි වූ නඩු භාණ්ඩ ප්‍රමාණය අඩු කිරීම

වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන නඩු භාණ්ඩ පිළිබඳ වාර්තා ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීම ඉතා වැදගත් වේ. මේ සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පුරප්පාඩු පිරවීම අත්‍යාවශ්‍ය වේ. දැනට සහකාර රස පරීක්ෂක නිලධාරීන් 28 දෙනෙකුගේ තනතුරු පුරප්පාඩු වී ඇති අතර විශේෂ අනුමැතියක් මත බඳවා ගැනීමට ඉල්ලුම් කර ඇත. තවද දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇති තනතුරු කිහිපයක්ම පුරප්පාඩු වී ඇති අතර එය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සඳහා සෘජුවම බලපාන බව පෙන්වා දෙමි. තවද නඩු භාණ්ඩ ලැබීම 2023 වර්ෂය තුළදී 2022 වර්ෂයට සාපේක්ෂව 37% ක ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇති අතර පවතින අධික පුරප්පාඩු තත්වය තුළදී පවා විශ්ලේෂණය අවසන් කර නඩු වාර්තා ඉදිරිපත් කිරීම 2022 වර්ෂයට සාපේක්ෂව 30% ක ප්‍රමාණයකින් ඉහළ නංවා ඇත.

දෛනිකව ඉදිරිපත් වන නඩු භාණ්ඩ මෙන්ම ඉහත පරිදි විශ්ලේෂණය අවසන් කිරීමට නොහැකි වූ නඩු සම්බන්ධ කටයුතු නිම කිරීම සඳහා නිලධාරීන් අතිකාල සේවයේ යෙදවීම අවශ්‍ය වන අතර සතියේ දිනවල අතිරේක පැය කිහිපයක් සේවය කිරීම මෙන්ම රජයේ නිවාඩු දින වල සේවයේ යෙදවීමටද සිදුවිය.

2. පර්යේෂණ හා සංවර්ධන අංශයක් ස්ථාපිත කිරීම

නවීනතම විද්‍යාත්මක ක්‍රමවේදයන් පිළිබඳ දැනුම දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ඉතා වැදගත් වේ. නව මත්ද්‍රව්‍යයන් හා රසායනිකයන් භාවිතයට එකතුවීම දිනපතා සිදුවන අතර දෙපාර්තමේන්තු නිලධාරීන් මෙම තත්ත්වයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුවත්භාවයක් සහිත වීම අවශ්‍ය වේ. මේ සඳහා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ට දේශීය මෙන්ම විදේශීය පුහුණු හා පශ්චාත් උපාධි අධ්‍යයන අවස්ථා ලබාදීම සිදුකල යුතුය.

3. අධිකරණ වලින් ඉදිරිපත් කරන ලද සාම්පල ඉවත් කිරීම


රටේ ක්‍රියාත්මක වන අධිකරණ ක්‍රමය තුළදී යම් නඩුවක් සඳහා අවසන් තීරණයක් ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් පරීක්ෂණ අවසන් කරන ලද නඩු භාණ්ඩ ඉවත් කර ගැනීම ප්‍රමාද වේ. නඩු භාණ්ඩ ලැබීම අධිකවීම නිසා ඒවා ගබඩා කර තැබීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිකම දැඩි ගැටළුවකි. මේ හේතුවෙන් වාර්තා ඉදිරිපත්

කල නඩු භාණ්ඩ දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් කාලානුරූපීව ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කල යුතුව ඇත. එබැවින් ගරු අධිකරණ අමාත්‍යතුමාගේ සහ අමාත්‍යාංශය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් මත්ද්‍රව්‍ය සහ අන්තරායකර ඖෂධ ඉවත්කිරීමේ කමිටුවක් පිහිටුවා ඇති අතර ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාද මෙම කමිටුවේ එක් සාමාජිකයෙකි. මේ වන විට පොලිස් නිලධාරීන් අධිකරණ නියෝගයන් අනුව නඩුභාණ්ඩ ඉවත් කිරීම සිදුකරනු ලබයි. 2023 වර්ෂයේ දී පමණක් මත්ද්‍රව්‍ය හා මනෝවර්ථක අංශයට අයත් නඩු භාණ්ඩ 27,827 ප්‍රමාණයක් ඉවත් කර ගෙන ඇත.

4. වීඩියෝ තාක්ෂණ ඔස්සේ විශේෂඥ සාක්ෂි ලබාදීම.

දිවයින පුරා පිහිටා ඇති අධිකරණ වල සාක්ෂි ලබාදීම සඳහා නිලධාරීන් සහභාගී කරවීමේදී මතුවන ගැටළු අවම කර ගැනීම සඳහා මාර්ගගත වීඩියෝ තාක්ෂණය මගින් කඩිනමින් සාක්ෂි ලබාදීමේ ක්‍රමයක් ඇති කිරීම ඉතාමත් වැදගත් වේ. මෙහි මූලික පියවරක් ලෙස වීඩියෝ තාක්ෂණ උපකරණ කට්ටල දෙකක් අධිකරණ අමාත්‍යාංශය හා UNDP ව්‍යාපෘතිය මඟින් අප දෙපාර්තමේන්තුවට ලබාදුන් අතර ඒවා දැනටමත් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇත. කෙසේ වුවද දැනට දුරස්ථ සාක්ෂි ලබාදීම පිළිබඳ පැහැදිලි නීතිමය ප්‍රතිපාදනයක් නොමැති බැවින් ඒ සඳහා අදාල ආයතන සහ අංශ ක්‍රියාත්මක වී අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සහ අන පනත් කඩිනමින් ස්ථාපිත විය යුතු බවද පෙන්වා දෙමි.





වීඩියෝ තාක්ෂණය ඔස්සේ විශේෂඥ සාක්ෂි ලබාදීම මේ වන විට අවස්ථා කීපයකදී සිදු කලද නෛතික ප්‍රතිපාදන නොමැති බැවින් අධිකරණය මගින් එය ක්‍රියාත්මක කිරීමට පසුබට වී ඇත. මෙම ක්‍රමය යටතේ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ට රට පුරා පැතුරුණු විවිධ අධිකරණ වලට තම විශේෂඥ සාක්ෂි ලබාදීම කළ හැකිනම් භෞතිකව සහභාගීවීමට ගත වන කාලය විශාල වශයෙන් ඉතිරි වන නිසා කාලය වඩාත් ඵලදායීව රාජකාරී කටයුතු සඳහා යෙදවීමට හැකිවීම මෙන්ම රජයේ වියදම්ද සාපේක්ෂව අවම කර ගත හැකි බව පෙනේ.

5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම

දිනෙන් දින වර්ධනය වන නඩු භාණ්ඩ ලැබීම කළමනාකරණය කර ගත හැකි පරිදි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම ඵලදායීතාවය වර්ධනය කිරීම කෙරෙහි බලපානු ලබයි. ICTA ආයතනය මඟින් අදියර දෙකකින් යුත් ව්‍යාපෘතියක් ලෙස මෙම මෙහෙයුම් මෘදුකාංගයන් ලබාදීමට බලාපොරොත්තු වන අතර පලමු අදියර දැනට සංවර්ධනය කර ඇත. ප්‍රායෝගික ගැටළු කිහිපයක් නිරාකරණය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් එම මෘදුකාංගය 2023 වර්ෂය තුලදී ද ස්ථාපනය කිරීමට නොහැකි විය.

6. පරීක්ෂණාගාර වල විශ්ලේෂණ කටයුතු කළමනාකරණය සඳහා පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කිරීම

ඉදිරිපත් වන සාම්පල හා රසායනාගාර වල තොරතුරු ඵලදායීව හැසිරවිය හැකි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම මේ යටතේ අපේක්ෂා කෙරේ.

7. යටිතල පහසුකම් සංවර්ධනය

UNDP ආයතනය සමඟ Support To Justice Sector Project (JURE) නමින් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ පූර්ණ එකඟතාවය මත ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතිය 2025 වර්ෂය තෙක් ක්‍රියාත්මක වීමට නියමිත අතර, එම ව්‍යාපෘතියේ පළමු පියවර ලෙස දෙපාර්තමේන්තුවේ එක්රැස් වී ඇති විශාල නඩු භාණ්ඩ ප්‍රමාණයක් විශ්ලේෂණය කර අවසන් කිරීමේ අරමුණ ඇතිව විද්‍යාත්මක නිලධාරීන් 15 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට මූල්‍යම දායකත්වය ලබා දෙන ලදී. ඒ අනුව එම නිලධාරීන් 15 දෙනා අතරින් මත්ද්‍රව්‍ය හා මනෝවර්තක රසායනාගාරයට නිලධාරීන් 06 දෙනෙකු, අධිකරණ මස්තු විද්‍යා හා ඩී.එන්.ඒ. රසායනාගාරයට නිලධාරීන් 04 දෙනෙකු , අධිකරණ ධූලක විද්‍යා රසායනාගාරයට නිලධාරීන් 03 දෙනෙකු හා පරිගණක හා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරයට නිලධාරීන් 02කු ලෙස අනුයුක්ත කරන ලදී. එම නිලධාරීන් අනුයුක්ත කිරීමෙන් පසු 2023 වර්ෂයේදී අධිකරණ ධූලක විද්‍යා රසායනාගාරයේ එම නිලධාරීන් මඟින් 342 ප්‍රමාණයක් විශ්ලේෂණය කළ අතර, මත් ද්‍රව්‍ය හා මනෝවර්තක රසායනාගාරයේ 3759 පමණ නඩු භාණ්ඩ ප්‍රමාණයක් විශ්ලේෂණය කිරීමට හැකියාව ලැබී ඇත. තවද අධිකරණ මස්තු විද්‍යා හා ඩී.එන්.ඒ. විද්‍යාගාරය නඩු භාණ්ඩ 401 විශ්ලේෂණය කිරීමට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ට සහාය දක්වා ඇත. තවද පරිගණක හා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරයේ නඩු භාණ්ඩ 36 ක් විශ්ලේෂණය කර තවත් නඩු භාණ්ඩ 30 ක් විශ්ලේෂණය කිරීමට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ට සහාය දක්වා ඇත.
තවද 2023 වර්ෂයේදී JURE ව්‍යාපෘතිය යටතේ සැකකටයුතු ලේඛන විද්‍යාගාරය වෙත GCMS උපකරණයක් ප්‍රදානයක් ලෙස ලැබුණු අතර එහි වටිනාකම රු. 27,363,635.00 ක් පමණ වේ. එම උපකරණය මඟින් අධිකරණ හා වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන විසින් සැකකටයුතු ලේඛන අංශය වෙත එවනු ලබන තීන්ත GC-MS යන්ත්‍රය භාවිතයෙන් රසායනික විශ්ලේෂණය සිදු කරයි. මෙම තීන්ත විශ්ලේෂණය මඟින් අදාලව එවන ලිපිවල සටහන ලියූ කාලය නිර්ණය කිරීම, ලිවීම් උපකරණය හඳුනාගැනීම, යම් සටහනකට සිදු කර ඇති වෙනස්කිරීම් හා එකතුකිරීම් හඳුනාගැනීම සහ තීන්තවල සංයුතිය හඳුනාගැනීම සිදු කරනු ලබයි. මෙම රසායනික විශ්ලේෂණය මඟින් යම් අපරාධයකට සම්බන්ධ නඩුභාණ්ඩ විද්‍යාත්මකව හඳුනාගැනීම නිසා අධිකරණවලට යුක්තිය පසිඳලීම පහසු කරයි.

2023 වර්ෂය තුළදී UNDP මූල්‍යමය දායකත්වය යටතේ බඳවා ගන්නා ලද විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගේ සහ ප්‍රදාන වලින් දෙපාර්තමේන්තුවේ විවිධ රසායනාගාර වෙත ලැබුණු උපකරණ වල ඡායාරූප පහත දක්වා ඇත.


<u>බඳවා ගන්නා ලද විද්‍යාත්මක සේවයේ නිලධාරීන්.</u>



DNA Laboratary



Narcotic Laboratory



Toxicology Laboratory

<u>ප්‍රදානය කරන ලද උපකරණ සහ එම පුහුණු කිරීම්.</u>



EQD Laboratory - GCMS Training



EQD Laboratory - GCMS Training by USA experts



EQD Laboratory - GCMS Training



EQD Laboratory - GCMS Training




Digital Heated Ultrasonic Cleaner for CD Lab

තවද මෙම ව්‍යාපෘතිය යටතේ රු. 1,331,021.61ක් වටිනා Digital Heated Ultrasonic Cleaner උපකරණය රසායනාගාරයේ භාවිතා වන වීදුරු උපකරණ ඉතා ම හොඳින් පිරිසිදු කිරීම සඳහා භාවිතා කෙරේ. එමෙන්ම සාම්පල වර්ග රසායන ද්‍රවය වල දිය කිරීමේ දී වඩා ම හොඳින් මිශ්‍ර කිරීම සඳහාද භාවිතා කරයි. සාම්පල පිළියෙල කිරීමේදී රැඳී තිබෙන වාතය ඉවත් කිරීමට (degas) උපකාරී වෙයි.



Fourier Transform Infrared Spectroscopy (FTIR)

තවද UNDP ව්‍යාපෘතිය යටතේ රු. 34,913,695.99 ක් වටිනා Fourier Transform Infrared Spectroscopy (FTIR) උපකරණයක් ප්‍රදානයක් ලෙස ලැබුණු අතර මත්ද්‍රව්‍ය රසායනාගාරයට ඉදිරිපත් වන සාම්පල වල අඩංගු වන මත්ද්‍රව්‍ය හඳුනාගැනීමට සහ එහි අනන්‍යතාවය තහවුරු කර ගැනීමට මෙම උපකරණය භාවිතා කරයි.



Nitrogen Evaporator

UNODC ව්‍යාපෘතිය යටතේ රු. 1,136,331.99 වටිනා Nitrogen Evaporator උපකරණය ලැබුණු අතර chromatography හා Liquid chromatography යන ක්‍රමද භාවිතා කරමින් සාම්පල විශ්ලේෂණ කටයුතු සිදු කිරීමේදී එම සාම්පල වල සාන්ද්‍රණය වැඩි කිරීමට සහ වියලි තත්ත්වයට පත්කිරීමට Nitrogen Evaporator උපකරණය භාවිතා කරයි. මෙහිදී නයිට්‍රජන් වායු ධාරාවක් සාම්පලය හරහා යැවීමට සාන්ද්‍රණය වැඩි සාම්පලයක් ලබා දේ. මත්ද්‍රව්‍ය විශ්ලේෂණයේදී මෙම ක්‍රමවේදය වඩා උපකාරී වේ.



Hand Held Raman Spectrometre

මීට අමතරව මත්ද්‍රව්‍ය අංශයට UNODC ආයතනය ඇමරිකානු ඩොලර් 48,838.29ක Hand Held Raman Spectrometre 02ක් ප්‍රදානයක් ලෙස ලැබුණි.



Deep Freezer for DNA Lab

KOICA ව්‍යාපෘතිය යටතේ DNA රසායනාගාරය වැඩිදියුණු කිරීමත්, ඩිජිටල් රසායනාගාරය ස්ථාපිත කිරීමත් 2016 දී සිදු කරන ලදි. 2023 වර්ෂයේ දී එම ව්‍යාපෘතියට අදාලව පශ්චාත් කළමනාකරණ ක්‍රියාවලියක් ලෙස ඇමරිකානු ඩොලර් 20,000 ප්‍රදානයක් සිදු කරන ලදි. එමගින් DNA රසායනාගාරයට DNA පරීක්ෂණ සඳහා යොදා ගන්නා ජීව විද්‍යාත්මන සාම්පල (ඇටකටු, පේශී කොටස් හා දත් යන ආදිය) විනාශ නොවන පරිදි නියමිත උෂ්ණත්වයේ ගබඩා කළ හැකි -25^{0}C උෂ්ණත්වය ඇති අධි ශීතකරණයක් විද්‍යාගාර අවශ්‍යතා වෙනුවෙන් ප්‍රදානයක් ලෙස ලැබුණු අතර එය රු. 2,047,920.00ක වටිනාකමින් යුතු විය. මෙම අධි ශීතකරණයේ ජීව විද්‍යාත්මක සාම්පල විශාල ප්‍රමාණයක ගබඩා කිරීමේ ධාරිතාවක් ඇත. එබැවින් DNA රසායනාගාරයේ පරිහරණය සඳහා මෙය ඉතා ප්‍රයෝජනවත් වේ.







NAS System, UPS and Printers for EQD Lab

රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ඩිජිටල් අධිකරණ විද්‍යා විද්‍යාගාරය KOICA පරිත්‍යාග යටතේ ස්ථාපිත කරන ලදී. 2023 වර්ෂයේ දී KOICA ව්‍යාපෘතිය විසින් 2016 මුල් ව්‍යාපෘතියේ පශ්චාත් කළමනාකරණ ක්‍රියාවලියක් සිදු කරන ලද අතර ඩිජිටල් අධිකරණ විද්‍යා රසායනාගාරයේ අවශ්‍යතා කිහිපයක් හඳුනා ගන්නා ලදී. ඒ අනුව ඩිජිටල් අධිකරණ විද්‍යා විද්‍යාගාරය සඳහා US$ 7500ක් වෙන් කර වර්ණ මුද්‍රණ යන්ත්‍ර දෙකක් (1 - EQD Lab, 1- Digital Lab), 3KVA UPS එකක් සහ NAS පද්ධතියක් මිලදී ගන්නා ලදී. ඩිජිටල් අධිකරණ විද්‍යා රසායනාගාරයේ වාර්ෂික ගබඩා අවශ්‍යතාවය TB 30 කට ආසන්න වේ. KOICA විසින් වසර දෙකකට වැඩි කාලයක් භාවිතා කළ හැකි 65TB සහිත NAS පද්ධතියක් පරිත්‍යාග කරන ලද අතර මෙම NAS පද්ධතියේ මෘදුකාංගය ඉතා අඩු වියදමකින් හා පහසුවෙන් යාවත්කාලීන කළ හැක.



Universal Comparison Microscope for CF Lab

තවද දේශීය අරමුදල් යටතේ 2023 වර්ෂයේ පෙබරවාරි මස මූල්‍යමය වටිනාකම රු. 66,453,837.08 ක් වන Universal Comparison Microscope උපකරණයක් ආනයනය කරන ලද අතර එම උපකරණය ගිනි අවි හා සම්බන්ධ අපරාධ වලදී, අධිකරණ සාක්ෂි විශ්ලේෂණයේ ඉතාම වැදගත් අංගයක් වන වෙඩි තැබූ උණ්ඩයක් හෝ පතරොම් කොපුවක් සැක කටයුතු ගිනි අවියක් මඟින් වෙඩි තබා තිබේදැයි නිර්ණය කිරීම සඳහා යොදා ගනියි. මේ අනුව අපරාධකරුවා සහ අපරාධ ස්ථානය හා ගිනි අවිය අතර සම්බන්ධය අධිකරණය ඉදිරියේ විද්‍යාත්මකව තහවුරු කර ගැනීමට හැකියාවක් තිබේ. මෙය, ගිනි අවි හා සම්බන්ධ අධිකරණ විද්‍යා විශේෂඥයෙකු මඟින් ඉටු කල යුතු ඉතා වැදගත් හා සංකීර්ණ කාර්යභාරයකි. මෙය සිදු කරනු ලබන්නේ අදාළ සැක කටයුතු ගිනි අවිය මඟින් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වෙඩිතලාවේදී (firing range) පරීක්ෂා වෙඩි තැබීම සිදු කර ලබා ගන්නා පතරොම් කොපු සහ උණ්ඩ මත ඇති අන්වීක්ෂය ගිනි අවි ලකුණු, අපරාධ ස්ථානයෙන් සාක්ෂි ලෙස එකතු කරන ලද පතරොම් කොපු හා උණ්ඩ මත ඇති අන්වීක්ෂය ගිනි අවි ලකුණු සමඟ සැසඳීම සිදු කරයි.

<u>2023 වර්ෂයේ දෙපාර්තමේන්තුවට විශ්ලේෂණය සඳහා ලැබුණු නඩු භාණ්ඩ අතුරින් සුවිශේෂ සිද්ධීන්.</u>

<u>පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශය</u>

1. තිරික්කෝවිල් පොලිස් ස්ථානයට අනුයුක්තව තිබූ ජීප් රථයක 2023.03.18 රාත්‍රී කාලයේ ඇතිවූ ගින්න පිළිබඳව විමර්ශනයෙන් ලත් ප්‍රතිඵල මත එම ගින්න පෙට්‍රල් භාවිතා කර හිතා මතා ගිනි තැබීමෙන් ආරම්භ වී ඇති බව සොයා ගැනීම.
2. කදපොල ප්‍රදේශයේ තේ කර්මාන්ත ශාලාවක 2023.03.18 දින ඇති වූ ගින්න විමර්ශනයෙන් එම ගින්න පෙට්‍රල් යොදා හිතා මතා ගිනි තබා ඇති බව අනාවරණය කර ගැනීම.
3. කොළඹ ජාතික රෝහලේ ස්නායු ක්ෂත ඒකකයේ වායු සැපයුම් යන්ත්‍ර කාමරය 2023.08.12 දින ගින්නෙන් හානි වීම පිළිබඳව ස්ථානීය පරීක්ෂාවෙන් හා අනතුරුව එම ස්ථානයෙන් ලබාගත් ගිනි සුන්බුන් සාම්පල විද්‍යාගාරයේ දී විශ්ලේෂණයෙන් ලත් ප්‍රතිඵල මත එම ගින්න හිතා මතා ගිනි තැබීමෙන් ආරම්භ වී ඇති බවට විශේෂඥ මතය පල කිරීම.
4. 2023.11.29 දින පානගමුව ප්‍රදේශයේ නිවසක් තුළ සිදු වූ පිපිරීමට අදාලව පරීක්ෂා කර එම පිපිරීම එම නිවස තුළ අනවසරයෙන් පුපුරණ ද්‍රව්‍ය හා පිපිරුම් උපක්‍රම ගබඩා කර තබා තිබියදී කෑම පිසින විටක ගිනි පුළිඟු වැටීමෙන් එම පිපිරුම් උපක්‍රමයක් හදිසියේ පුපුරා යාමෙන් සිදුව තිබූ බව තහවුරු කර ගැනිම.
5. 2023.11.30 දින ගින්නෙන් හානි වූ, රුහුණු විශ්ව විද්‍යාලයේ ධිවර හා තාක්ෂණ විද්‍යා පීඨයේ විද්‍යාගාර කාමරයක් පරීක්ෂා කර එම ගින්න විද්‍යාගාර උපකරණයක බැටරි පද්ධතියේ දෝෂයක් හේතුවෙන් ආරම්භ වූ ගින්නක් ලෙස හඳුනා ගැනීම.
6. අනුරාධපුර ශික්ෂණ රෝහලේ වාට්ටු අංක 10 ගින්නෙන් හානි වීම පිළිබඳව 2023.12.18 දින පරීක්ෂා කර එම ගින්න එහි වහලය මත වූ සූර්ය පැනලයකට අයත් විදුලි රැහැන් වල සිදුවූ විදුලිය ලුහුවත් වීමක ප්‍රතිඵලයක් ලෙස ආරම්භ වී ඇති බවට තහවුරු කර ගැනීම.

7. 2023.12.26 දින රාත්‍රී කාලයේ අවිස්සාවේල්ල දිස්ත්‍රික් රෝහලේ දුරකථන පද්ධති පාලන කාමරයේ හට ගත් ගින්න එම කාමරයේ දුරකථන පද්ධති පාලනය සඳහා උපයෝගී කර ගන්නා විදුලි උපාංගයක දෝෂයක් හේතුවෙන් හටගත් බවට මතයක් පල කිරීම.

<u>මත්ද්‍රව්‍ය අංශය</u>

2023 වර්ෂයේදී මත්ද්‍රව්‍ය අංශයට නඩු භාණ්ඩ 28133 ක් ලැබුණු අතර එය මෙතෙක් කාලයක් වර්ෂයක් තුල මත්ද්‍රව්‍ය අංශයට ලැබුණු වැඩිම නඩු භාණ්ඩ ප්‍රමාණය වේ. මේ අතර කිලෝග්‍රෑම් 100 - 300 අතර බර ප්‍රමාණ වලින් යුතු හෙරොයින් සහ මෙත්ඇම්ෆටමින් වලට අදාල නඩු භාණ්ඩ 05ක් මත්ද්‍රව්‍ය අංශය මඟින් භාරගෙන විශ්ලේෂණ කටයුතු සිදු කරන ලදී. එමෙන්ම ඇම්ෆටමින් කාණ්ඩයේ මත්ද්‍රව්‍යයක් වන MDMA (3, 4 - Methylenedioxy Phenethylamine) නිෂ්පාදනයට යොදාගන්නා පූර්වජ රසායනයක් වන 3, 4 MDP-2-P යන රසායනික සංයෝගයද, සංස්ලේෂිත කැනබිනොයිඩ (Synthetic Cannabinoids) වර්ගයට අයත් සංයෝගද, 2023 වර්ෂයේ දී ප්‍රථම වරට මත්ද්‍රව්‍ය රසායනාගාරයේ දී විශ්ලේෂණය කර හඳුනා ගන්නා ලදී.

<u>සැකකටයුතු ලේඛන අංශය</u>

අධිකරණ හා වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන විසින් සැකකටයුතු ලේඛන අංශය වෙත එවනු ලබන තීන්ත GC-MS යන්ත්‍රය භාවිතයෙන් රසායනික විශ්ලේෂණය සිදු කරයි. මෙම තීන්ත විශ්ලේෂණය මඟින් අදාල සටහන ලියූ කාලය නිර්ණය කිරීම, ලිවීම් උපකරණය හඳුනාගැනීම, යම් සටහනකට සිදු කර ඇති වෙනස්කිරීම් හා එකතුකිරීම් හඳුනාගැනීම සහ තීන්තවල සංයුතිය හඳුනාගැනීම සිදු කරනු ලබයි. මෙම රසායනික විශ්ලේෂණය මඟින් යම් අපරාධයකට සම්බන්ධ නඩුභාණ්ඩ විද්‍යාත්මකව හඳුනාගැනීම නිසා අධිකරණවලට යුක්තිය පසිදලීම පහසු කරයි.

2023 වර්ෂයේදී සැකකටයුතු ලේඛන අංශය වෙත විශ්ලේෂණයට ලැබුණු නඩු භාණ්ඩ 1000කට ආසන්න ප්‍රමාණය අතර රටෙහි මහත් ආන්දෝලනයට ලක් වූ සිද්ධි රාශියක්ද විය.

1. මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයේ දැනට විභාගවන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉම්යුනොග්ලොබියුලින් නඩුව (immunoglobulin case) සඳහා එම අමාත්‍යාංශයේ මෙම අපරාධයට සම්බන්ධ ලේඛනවල වූ නිළධාරීන්ගේ අත්සන් හා අත්අකුරුවල අනන්‍යතාව තහවුරු කිරීම.
2. සුරාබදු දෙපාර්තමේන්තුව විසින් මත්පැන් බෝතල මත අලවන බදු ආදායම සම්බන්ධ ස්ටිකර පරීක්ෂා කර ඒවායේ ව්‍යාජ නිර්ව්‍යාජත්වය සම්බන්ධ පරීක්ෂණ සිදු කිරීම හා ව්‍යාජ ස්ටිකර හඳුනාගැනීම.
3. යුක්තිය මෙහෙයුමේදී මතභේදයට ලක්වූ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අවසරය නොමැතිව ඉදිකරනලද ඉදි කිරීම් ආදියට සම්බන්ධ ලේඛනවල ව්‍යාජ නිර්ව්‍යාජභාවය පරීක්ෂා කිරීම.
4. සංස්කෘතික අරමුදල සම්බන්ධ විමර්ශනයේදී එහි වූ අත්සන් වල ව්‍යාජ නිර්ව්‍යාජභාවය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම.

<u>අධිකරණ මස්තු විද්‍යා හා ඩී. එන්. ඒ. විද්‍යාගාරය.</u>

1. දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ මරණය සම්බන්ධයෙන් විද්‍යාත්මක විශ්ලේෂණ වාර්තාවක් නිකුත් කිරීම.
2. 2023 ජූලි මසදී කැකිරාව ප්‍රදේශයේ දී නීති නිලධාරිනියක විසින් පොතකින් ඉරා සපන ලදැයි සැක සහිත නීතිමය ලිපියක් එම කොටස් පරීක්ෂාකර පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම.
3. 2023 අගෝස්තු මසදී මහියංගනය ප්‍රදේශයේ දී චොකලට් පෙත්තක හමු වූ පෙව විද්‍යාත්මක කොටස (මනුෂ්‍ය ඇඟිලි කොටසක්) පිළිබඳව ජීව විද්‍යාත්මක වාර්තාව නිකුත් කිරීම.

දීපිකා සෙනෙවිරත්න
ආණ්ඩුවේ රස පරීක්ෂක

03 පරිච්ඡේදය

සමස්ථ මූල්‍යමය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

					ඒසිඒ-එල්
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය					
අයවැය **2023**		සටහන	තත්‍ය		
			2023	**2022**	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	**ඒසිඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		690,816,450	482,131,000	**ඒසිඒ-3**
-	තැන්පතු		12,099,750	484,458	**ඒසිඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		11,110,429	10,185,238	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**714,026,629**	**492,800,696**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**714,026,629**	**492,800,696**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**2,622**	**1,523**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**714,024,007**	**492,799,173**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
209,800,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	197,726,072	215,122,263	
502,450,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	467,006,620	256,329,827	**ඒසිඒ-2(ii)**
2,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	1,657,669	1,754,760	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
714,250,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**666,390,361**	**473,206,849**	

	මූලධන වියදම්				
4,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	3,550,920	3,137,836	
77,750,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	162,910,813	42,937,521	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
9,000,000	හැකියා වර්ධනය	**14**	8,930,490	11,579,876	
225,000,000	වෙනත් මූලධන වියදම්	**15**	-	103,935	
315,750,000	**මුළු මූලධන වියදම් (උ)**		**175,392,223**	**57,759,168**	
	තැන්පතු ගෙවීම්		9,582,125	436,784	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		8,217,486	8,932,732	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		17,799,611	9,369,516	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		859,582,195	540,335,534	
1,030,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(145,558,188)	(47,536,361)	
	අඟුම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(145,558,188)	(47,536,361)	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අඟුම ශේෂය		-	-	**ඒසිඒ-3**

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපල, ඕපාදූප හා උපකරණ	ඒඕස්-6	2,715,305,272	2,556,229,880
මූල්‍ය වත්කම්			
අත්කරගත් බිලපත්	ඒඕස්-5/5(ඒ)	19,566,424	22,459,367
මිලදී ගත මුදල් සමාන ද	ඒඕස්-3	-	-
මුළු වත්කම්		2,734,871,696	2,578,689,247
සැලසිය / බැඳීම්			
කොන්ත්‍රාත්කරු වෙත ඉදිරි වත්කම්		16,620,678	22,031,247
දේපල ඕපාදූප හා උපකරණ සංවිධාය		2,715,305,272	2,556,229,880
කුලී හා වැඩ අත්කරගත් සංවිධාය	ඒඕස්-5(බ)	-	-
ස්වාමි වගකීම්			
තැන්පතු බිලපත්	ඒඕස්-4	2,945,746	428,121
අදාළ පොළිය	ඒඕස්-3	-	-
මුළු වගකීම්		2,734,871,696	2,578,689,248

ඕවු අංක 09 සහ 25 දරණ ඒඕස් 1 සහ ඒඕස් 7 දරණ වූ ආයතන පනතේ ප්‍රතිපාදන අනුකරන මණ්ඩලය හා ඇතුලත් ඕවු අංක 26 සහ 46 දරණ ඇතුලත් බිලපත් සටහන් විෂයෙහි ද මෙම අවශ්‍යතා බිලපත්වල ආත්මවත සොයන් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සිදුකෙරූ කිරීම සොයුරේ බිලපත් මූල්‍යධිවිවරුට අනුකූලව සිදුකර ඇති අතර මේහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් සොදුදීවී කර ඇති පරිදි වඩාත් සුදුසු බිලපත්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවශ්‍යතා බිලපත්වල සඳහන් සංඛ්‍යා, ඊට අදාළ බිලපත් සටහන් හා අනෙකුත් බිලපත් සොයුරේ, කණ්ඩායමේ බිලපත් සොත් සමහ සැසඳීම් කර ඇති මවවන් ඒවා එම සංඛ්‍යා සමඟ එකතු වන සේ ඕවන් සොයන්ය කරනු ලැබේ.

මූල්‍ය තැලනය සඳහා වලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාමෙහිය මූල්‍ය තැලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය ඇගයීමෙහිය කිරීමවලින් ඒ අනුව එම පද්ධති වලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි අවශ්‍ය කිරීම් සිදුකිරීමට ඊට්ත් ඒ සම්බන්ධවිවන සියලුමන ඕවන් සොයන් කෙරේ.

.....
ප්‍රධාන ගණකාධිකරු නිලධාරි
නම :
තනතුර :
දිනය : 2024.02.21

.....
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.
ඩී.එන්. රණසිංහ මෙත්තම
අධ්‍යක්ෂ, බිම්බිසාර තවප්‍රභූ සහ
ඇණ්ඩ්‍රිලුම් වචස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නො. 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.
2024.02.21

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූල්‍ය/ සොයිකාරී (මූල්‍ය))
නම :
දිනය : 2024.02.21

						ඒසීඒපී-
2023 දෙසැම්බර් 31 දිනට						
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය						
				තත්‍ය		
		සටහන		**2023**		**2022**
		_	_	**රු.**		**රු.**
මූල්‍ය නොවන වත්කම්						
දේපළ, පිරියත හා උපකරණ		ඒසීඒ-6		2,715,305,272		2,556,229,880
මූල්‍ය වත්කම්						
අත්තිකාරම් ගිණුම්		ඒසීඒ-5/5(ඒ)		19,566,424		22,459,367
මුදල් හා මුදල් සමාන දෑ		ඒසීඒ-3		-		-
මුළු වත්කම්				**2,734,871,696**		**2,578,689,247**
ශුද්ධ වත්කම් / ස්කන්ධය						
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්				16,620,678		22,031,247
දේපළ පිරියත හා උපකරණ සංචිතය				2,715,305,272		2,556,229,880
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය		**ඒසීඒ-5(බී(**		-	-	-
ජංගම වගකීම්						
තැන්පතු ගිණුම්		ඒසීඒ-4		2,945,746		428,121
අග්‍රිම ශේෂය		ඒසීඒ-3		-		-
මුළු වගකීම්				**2,734,871,696**		**2,578,689,248**

3.3 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
	තත්‍ය	
	2023	**2022**
	රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	65,190,999	50,385,780
අග්‍රිම ලැබීම්	690,816,451	482,131,000
අත්තිකාරම් අයකර ගැනීම්	8,777,574	8,760,038
තැන්පතු ලැබීම්	12,099,751	484,458
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**776,884,775**	**541,761,276**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	663,136,768	476,118,080
සහනාධාර සහ මාරුකිරීම්	1,657,669	1,754,760
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	4,650,055	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	2,622	1,523
අත්තිකාරම් ගෙවීම්	8,217,486	8,932,732
තැන්පතු ගෙවීම්	9,582,126	436,784
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**687,246,726**	**487,243,879**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**89,638,049**	**54,517,397**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	164,345	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**164,345**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන		54,517,397

අත්කර ගැනීම්	89,802,394	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**89,802,394**	**54,517,397**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(89,638,049)**	**(54,517,397)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි **01** සිට දෙසැම්බර් **31** දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් **31** දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්කුවේ % ලෙස
20.02.01.01	රජයේ ගොඩනැගිලි කුලී	150,000	150,000	304,484.20	255
20.03.02.99	අනෙකුත් ලැබීම්	20,000,000	20,000,000	44,880,173.94	369
20.03.99.00	අනෙකුත් ලැබීම්	1000,000	550,000	9,994,930.64	372
20.02.02.99	අනෙකුත් ලැබීම් (පොළිය)	750,000	750,000	898,692.77	129
20.04.01.00	අනෙකුත් ලැබීම්	-	-	9,112,717.51	-
20.06.02.02	අනෙකුත් ලැබීම්	-	-	93,405.00	-
20.03.01.00				70,940.00	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

වැය විෂයය	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	වියදම සංශෝධිත ඇස්තහෙමින්තුවේ % ලෙස
	වාර්ෂික අයවැය වෙන්කිරීම	මුළු ශුද්ධ වෙන් කිරීම		
පුනරාවර්තන	714,250,000	714,250,000	666,390,361	93
මූලධන	315,750,000	315,750,000	175,392,223	56
එකතුව	1,030,000,000	1,030,000,000	841,749,685	82

3.7 මු.රෙ 208 අනුව ප්‍රතිපාදන පැවරීම

අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය	අරමුණ	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	වියදම සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස
			වාර්ෂික අයවැය වෙන්කිරීම	මුළු ශුද්ධ වෙන් කිරීම		
අදාල නැත.						

3.8 මූල්‍යමය නොවන වත්කම් වාර්තා කිරීම සම්බන්ධ ප්‍රගතිය

වත්කම් කේතය	ජංගම නොවන වත්කම්	භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ 2023.12.31 දිනට ශේෂය	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ 2023.12.31 දිනට ශේෂය	තවමත් ගණන් ගත යුතු	වාර්තා ගත ප්‍රගතිය % ලෙස
9151	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	1,100,000,000	1,100,000,000	-	100
9152	2.1 මෝටර් රථ වාහන	102,806,796	102,806,796	-	100
9152	2.2 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1,429,498,476	1,429,498,476	-	100
9153	ඉඩම්	83,000,000	83,000,000	-	100
9154	මූල්‍ය නොවන වතකම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	නොනිමි වැඩ	-	-	-	-
9180	කල්බදු වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/F/GAD/FS/02/2023 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 මැයි 16 දින

ආණ්ඩුවේ රස පරීක්ෂක

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

Zero Air Generator මැෂින් එකක්, **CPU** ඒකක හතරක් සහ Pen drive එකක් අපහරණය කර තිබුණද, ගත් මිල පොත්වලින් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 82)) ඉවත් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල නිවැරදි අගයක් පිළිඹිබු නොවී ය.

1.6.2 මුල්‍ය වත්කම්

දෙපාර්තමේන්තුවේ පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ආරම්භක ශේෂය රු.22,438,708 ක් වූ අතර, එම ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 52) අනුව රු.22,459,367 කි. ඒ අනුව ආරම්භක ශේෂ අතර රු.20,659 ක වෙනසක් නිරීක්ෂණය විය. වර්ෂය අවසානයේදී ද මෙම වෙනස දක්නට ලැබෙන අතර මෙය 1996 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එනු ලබන ශේෂ වෙනසක් වන අතර, එය සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය තුළදී අනතුරුවලට භාජනය වූ වාහන දෙකකට අදාළ ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
හානි හා පාඩු ලේඛනය	මුදල් රෙගුලාසි 110(1)	යාවත්කාලීන කර නොතිබුණි
විගණන විමසුම් ලේඛනය	මුදල් රෙගුලාසි 452(1)	යාවත්කාලීන කර නොතිබුණි

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම පිළිබඳ චක්‍රලේඛයෙහි 03 (xvii) වගන්තිය අනුව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම්, සාම්ප්‍රදායිකව සිදු කරන පරිදි ඒවා වර්ෂය අවසන්වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුව් ද, සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂයයන් 02 ක රු.9,750,000 ක් මුදල් රෙගුලාසි මඟින් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අයවැය ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියල කර, සලසා ඇති ප්‍රතිපාදන සීමාවන් තුළම වියදම් කළමනාකරණය කරගැනීමට කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 5 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 සහ පරිපූරක ඇස්තමේන්තු යටතේ වෙනත් අරමුණු සඳහා වෙන්කළ රු.35,750,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණි. වැය විෂයයන් අතර එලෙස මාරු කිරීමේ ප්‍රතිශතය සියයට 4 සිට සියයට 68 අතර පරාසයක් ගෙන තිබුණි.

(ඇ) අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන පූර්ව සැලැසුම් සකස්කර ප්‍රතිපාදන වෙන්කර නොගැනීම සහ මනා කළමනාකරණයකින් යුක්තව ප්‍රතිපාදන වැය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් පහක් සඳහා වෙන් කරන ලද රු.139,000,000 ක ප්‍රතිපාදන සියයට සියයක් ඉතිරි වී තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මඟින් දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන වෙන්කර නොමැති වැය විෂයයක් සඳහා (1405) රු.712,971 ක බැරකම්වලට එළඹී තිබුණි.

(ආ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 92) අනුව වැය විෂයයන් තුනක එකතුව රු.85,589,829 ක් සඳහා බැරකම්වලට එළඹී තිබූ නමුත්, එම බැරකම් දෙපාර්තමේන්තුවේ බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) මු.රෙ. 94 (1) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳි සිටිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් 02 ක් සඳහා ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා රු. 446,170 ක බැරකම්වලට එළැඹී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ හා බැරකම් ලේඛනයේ ඇතුළත් නොවූ රු.54,480 ක බැරකම් 2024 වර්ෂයේදී නිරවුල් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.85,589,829 ක් වටිනා යන්ත්‍රයක් වියදම් ප්‍රකාශනයේ (ACA -2(ii)) මුදල් පොතට අනුව වියදම තීරුවේ හා බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ (ඇමුණුම (iii)) ගෙවිය යුතු බැරකමක් ලෙස දක්වා තිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති රීති හා රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ) අංක CA/1/1/16/1 හා 2010 ජූලි මස 09 දිනැති ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා 1993/12/31 දිනැති අංක පිපිඒ/6/1/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය		නිලධාරීන් හයදෙනෙකු විසින් චක්‍රලේඛය පරිදි වාර්තාවන් ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි		
(i)	මුදල් රෙගුලාසි 104 (4)	වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 386 (4) හා 391 (අ)	දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ දින 60 ඉක්මවූ රු.541,942 ක් වටිනා වෙක්පත් 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.
(iii)	මුදල් රෙගුලාසි 771	දෙපාර්තමේන්තුව විසින් රු.25,175 ක් වටිනා රික්ත ශෝධකයක් (Vacuum Cleaner) රු.500 ක මුදලකට පරීක්ෂණ මණ්ඩලයේ අනුමැතියකින් තොරව වෙන්දේසි කර තිබුණි.
(iv)	මුදල් රෙගුලාසි 772 (2) (ආ)	භාණ්ඩ වෙන්දේසියේදී වෙන්දේසි කරන ලද භාණ්ඩවලට අදාළ ලේඛනයෙහි කමිටු සාමාජිකයන් විසින් අත්සන් කර නොතිබුණි.
(v)	මුදල් රෙගුලාසි 772 (ඉ)	විකුණන ලද භාණ්ඩ ද, ඒවාට ලැබුණු මිල ගණන් ද, විනාශ කරන ලද භාණ්ඩ ද පිළිබඳව මණ්ඩලයේ සාමාජිකයෙකුගේ සහතිකයක් මණ්ඩලයේ වාර්තාවට අමුණා නොතිබුණි.

(vi) මුදල් රෙගුලාසි 1646	දෙපාර්තමේන්තුවට අයත් වාහන 24 සඳහා ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා ඉදිරිපත්කොට නොතිබුණි.
(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 (4) (2) වගන්තිය හා 4 (2) (2) ඡේදය	චක්‍රලේඛය පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතුකර නොතිබුණි.
(ඇ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2023/05 6.2 ඡේදය	මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්තාකරන ආයතනයේ වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුව ද, පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශනය සහ අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රකාශන තුළ හිස් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

2.5 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 9.1 (ආ) හා මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවද, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් අවස්ථා 27 කදී ලබාගත් රු. 764,000 ක අතුරු අග්‍රිම පියවීමට දින 12 සිට දින 49 දක්වා කාලපරාසයක් ප්‍රමාද කර තිබුණි.

(ආ) අදාළ වියදම නිසියාකාරයෙන් ඇස්තමේන්තු කිරීමකින් තොරව අත්තිකාරම් මුදල් ලබාගෙන තිබූ අතර , ඒ අනුව ලබාගත් මුදල් හා වියදම් කළ මුදල් අතර සියයට 27 සිට සියයට 76 ක පරාසයක ඉතිරිවීම් පැවතුණි.

2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හඳුනානොගත් ලැබීම් වටිනාකම රු.217,000 ක් වූ අතර, ඒ තුළ මාස 01 සිට මාස 02 දක්වා වූ හඳුනානොගත් ලැබීම් රු.21,500 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදය ප්‍රකාරව සියලුම දෙපාර්තමේන්තු අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු අතර, ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර ඇති ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද දිනය සඳහන් කර නොතිබුණු අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ද ලබාගෙන නොතිබුණි.

(ආ) යටෝක්ත චක්‍රලේඛයේ 03 ඡේදයේ මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ වගකීම් ක්ෂේත්‍රය හා වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් පැහැදිළිව සඳහන් කර නොතිබූ අතර, අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර අන්තර්ගත වී නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම මූලධන වියදම් දැරීම සඳහා පමණක් සකස් කර තිබූ අතර, ආයතනයේ ප්‍රධාන කාර්යය ඉටු කිරීම සහ අනෙකුත් පුනරාවර්තන වියදම් දැරීම පිළිබඳව ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්ම තුළට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) 2023 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචිත වර්ෂය තුළදී සංශෝධනය කර තිබුණද, ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

(අ) සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අංශ 12 ක් සඳහා නඩු 12,189 ක් පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සඳහා ඉතිරි වී තිබුණු අතර, 2023 වර්ෂයේ දී තවත් නඩු 58,886 ක් ලැබී තිබුණි. මින් 2023 වර්ෂය තුළදී වාර්තා කළ නඩු සංඛ්‍යාව 53,253 ක් වූ අතර, වර්ෂය අවසානයේදී විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කිරීම සඳහා නඩු 17,822 ක් ඉතිරි වී තිබුණි. එය 2023 වර්ෂය තුළ පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සඳහා තිබූ නඩු සංඛ්‍යාවෙන් සියයට 30 ක් විය.

(ආ) මෙසේ විමර්ශනය කර වාර්තා ඉදිරිපත් කිරීමට තිබූ නඩු ප්‍රමාණයෙන් 885 ක් 2014 – 2020 කාල පරිච්ඡේදයට අදාළ ඒවා බව නිරීක්ෂණය විය.

(ඇ) සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ක්‍රියාකාරකම් හයක් සඳහා රු.මිලියන 225 ක් වෙන්කර තිබුණද, එම ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවා නොතිබුණි.

3.2 විදේශ ආධාර ව්‍යාපෘති

2021 - 2024 කාල සීමාව සඳහා කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (KOICA) මඟින් දෙපාර්තමේන්තුවේ ධාරිතා වර්ධනය කිරීම සඳහා ඇමෙරිකන් ඩොලර් මිලියන 4.5ක ප්‍රදානයක් ලබාදී තිබුණි. මින් 2022 වර්ෂය සඳහා රු.103,935 ක මුදලක් වියදම් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 100 ක් ඇස්තමේන්තු කර තිබුණද KOICA ආයතනය විසින් කිසිදු වියදමක් වාර්තා කර නොතිබුණි.

3.3 ප්‍රසම්පාදනයන්

2020 අගෝස්තු 28 දිනැති මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 02/2020 චක්‍රලේඛයෙහි 4 ඡේදය අනුව සියලුම රජයේ ආයතන, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු අතර, ගණන්දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුවේ වෙන්දේසි කමිටුව විසින් වෙන්දේසි කළ යුතු භාණ්ඩ සඳහා අවම මිලක් තීරණය කර තිබුණද, ඊට පටහැනිව අවම මිලට වඩා අඩුවෙන් භාණ්ඩ වර්ග හතරක් වෙන්දේසි කර තිබූ අතර, ඒ සඳහා කමිටුවෙහි අනුමැතිය ලැබූ බවට තොරතුරු නිරීක්ෂණය නොවීය.

(ආ) 2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018, මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයේ 1.3.4 අනුව වාහනයකට සිදු වූ අනතුරකදී රු. ලක්ෂ 05 කට වඩා වැඩි අලුත්වැඩියා වියදමක් දරන්නට සිදුවුවහොත් අලුත්වැඩියාවෙන් පසු එහි වටිනාකම තක්සේරු කළ යුතු අතර, එම තක්සේරු වටිනාකම වාහනයේ වටිනාකම ලෙස සැලකිය යුතු වුවද, දෙපාර්තමේන්තුව සතු එක් වාහනයක් අනතුරින් පසු රු.2,835,853 ක් දරා අලුත්වැඩියාව කර තිබුණද, අලුත්වැඩියාවෙන් පසු එම වාහනය තක්සේරු කර වටිනාකම ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) යථෝක්ත මාර්ගෝපදේශයේ 2.3, 3.3.1 සහ 4.3 ඡේද ප්‍රකාරව සෑම වර්ෂ 05 කට වරක්ම ඉඩම් හා ගොඩනැගිලි, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ සහ පිරියත හා යන්ත්‍රෝපකරණ සඳහා නැවත තක්සේරු කිරීමක් සිදු කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් එසේ කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයේ සංශෝධිත මුදල් රෙගුලාසි 880 අනුව රජයේ නිලධාරීන්ට ඇප තැබීම පිළිබඳව රාජ්‍ය මුදල් ආදියේ භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින් නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වගබලා ගැනීම කළ යුතු යැයි සඳහන් කර තිබුණද, මුදල් රෙගුලාසි 315 හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇප මුදල් තැන්පත් කර නොතිබුණි.

3.6 පාඩු හා හානි

දෙපාර්තමේන්තුවේ 2003 පෙබරවාරි 14 දින සිදු වූ ගිනි අනතුරින් වූ රු.2,229,111 ක් වූ හානිය පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් කර තිබුණ ද, එය අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

3.7 කළමණාකරණ දුර්වලතා

(අ) 2022 වර්ෂයේ දී වෙනත් අමාත්‍යාංශයක් වෙත මාරු වී ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.98,016 ක ආපදා ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් අය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.427,345 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2019 ජුනි 27 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2019 හි 03 (අ) ඡේදය ප්‍රකාරව නිලධාරියෙක් මාරු වී පැමිණ මාස දෙකක් ගත වීමෙන් පසු හෝ නිලධාරියෙක් මාරු වී ගොස් මාස තුනක් ගත වීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොපෙන්වීමට වගබලා ගත යුතු වුව ද, දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු වූ නිලධාරීන් හත් දෙනෙකුගේ එකතුව රු.1,429,506 ක් වූ ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා මාස 04 සිට 11 දක්වා කාලයක් ගත වී තිබූ අතර, ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් පස් දෙනෙකුගේ එකතුව රු. 1,064,668 ක් වූ ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා මාස 05 ත් 06 ත් අතර කාලයක් ගතවී තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු 2022 වර්ෂයේ ස්ථාන මාරු වීම් ලබා ගොස් තිබූ අතර, ඔහුගේ ණය ශේෂය වූ රු.107,093 න් 2023 වර්ෂයේදී රු.9,077ක් පමණක් නිරවුල් කර තිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ නිලධාරීන් සිය සේවා කාලයෙන් පරිබාහිරව ඉටුකරනු ලබන සේවාවන් වෙනුවෙන් අදාළ ගාස්තු ලබා ගැනීමක් කරනු ලබන අතර, 2016 වර්ෂයෙන් පසු මෙම ගාස්තු සංශෝධනය කිරීමක් සිදුකර නොතිබුණි. එසේම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2015 දෙසැම්බර් 11 දිනැති අංක PFD/04/08/01/59 දරන ලිපිය අනුව ගාස්තු සංශෝධනය වසර තුනකට වරක් සමාලෝචනය කර නිසි පරිදි සංශෝධනය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඊ) 2023 මැයි මස 14 වන දින WP NA 9276 දරන රථයේ සිදු වූ අනතුර සම්බන්ධයෙන් මු.රෙ 104(4) ප්‍රකාර පරීක්ෂණ වාර්තාවට අනුව, අනතුර හේතුවෙන් දෙපාර්තමේන්තුවට සිදුවී ඇති වියදම පියවා ගැනීම සඳහා මුළු අලාභයේ වටිනාකමින් සියයට එකක් රියදුරුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණද, එසේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වැටුප් රහිත නිවාඩු ලබාගෙන විදේශගත වූ දෙපාර්තමේන්තුවේ නිලධාරිනියන් දෙදෙනෙකු නැවත සේවයට වාර්තා කර නොතිබීම හේතුවෙන් එම නිලධාරිනියන් දෙදෙනාගෙන් අයකර ගත යුතු ව තිබූ රු.2,260,935 ක මුළු දණ්ඩන මුදල අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) විදේශීය පශ්චාත් උපාධි සඳහා වැටුප් සහිත නිවාඩු ලබා ගෙන 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා 2021 සැප්තැම්බර් මස විදේශ ගත වූ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂකවරයකු එරටේදී අසනීපවීම හේතුවෙන් 2022 ඔක්තෝබර් මස නැවත ලංකාවට පැමිණ තිබුණු අතර, එම නිලධාරියාට පාඨමාලා ගාස්තු ඇතුළුව අනෙකුත් වියදම් සඳහා රු. 6,281,948 ක මුදලක් වැයවී තිබුණි. මින් පාඨමාලා ගාස්තුව ලෙස ගෙවන ලද රු.5,224,681 ක මුදලින් රු.4,816,556 ක මුදලක් විශ්ව විද්‍යාලය විසින් නැවත ගෙවා තිබූ අතර, ඉතිරි මුදල වූ රු.408,125 ක් සහ ඊට අමතරව දෙපාර්තමේන්තුව විසින් වැයකළ රු.1,057,267 ක මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. එමෙන්ම මෙම නිලධාරියා මෙරටට 2022 ඔක්තෝබර් 28 දින පැමිණිය ද, විදේශගත වී සිටි කාල පරිච්ඡේදයට අදාළ නිවාඩු විගණන දිනය වූ 2024 මාර්තු 30 වන විටත් අනුමත කර ගෙන නොතිබුණි.

4. තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණක් ලෙස නඩු භාණ්ඩ විශ්ලේෂණයෙන් අනතුරුව නිකුත් කරන විද්‍යාත්මක වාර්තා මාස 03 ක කාලයක් තුළ ලබාදීම අරමුණ කර එම අරමුණ ඉටුවන ආකාරයෙන් කාර්යසාධන දර්ශක හතරක් හඳුන්වා දී තිබුණි. ඉන් එක් දර්ශකයක් ලෙස පෙර වර්ෂවල ලැබුණු විශ්ලේෂණය සඳහා තවදුරටත් ඉතිරිව ඇති නඩු භාණ්ඩ/ සාම්පල/ පරීක්ෂණවලට අදාළ විශ්ලේෂණ වාර්තා ප්‍රවර්තන වර්ෂය තුළ නිකුත් කර අවසන් කිරීම ඉලක්ක කර තිබුණද , එම අරමුණ කරා ළඟාවීම සියයට 59 ක් වූ අඩු මට්ටමක පැවතිණි. එසේම විද්‍යාගාර දෙකක නවීකරණය කිරීම සියයට 70 ක ප්‍රගතියක් ඉලක්ක කළද, සමාලෝචිත වර්ෂය තුළ එය සියයට 40 ක මට්ටමක පැවතුණි.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 (i) ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥාප්තියක් සකස් කොට ක්‍රියාත්මක කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් පුරවැසි / සේවාලාභී ප්‍රඥාප්තියක් සකස් කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (i) වගන්තියට අනුව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

5.3 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) සෑම අස්ථිතයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබිය යුතු වුවද, දෙපාර්තමේන්තුව සඳහා එවැනි කමිටුවක් පිහිටුවා නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) දෙපාර්තමේන්තුවෙහි 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	125	90	35
තෘතීයික මට්ටම	10	03	07
ද්විතීක මට්ටම	131	80	51
ප්‍රාථමික මට්ටම	84	59	25
එකතුව	350	232	118

(ආ) ආයතනයේ කටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට උපකාරී වන තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 35 ක් හා තෘතීයික මට්ටමේ නිලධාරීන් 10 දෙනෙකුගෙන් 7 දෙනෙකුගේ තනතුරු පුරප්පාඩු වී තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු මනා ලෙස හසුරුවා ගැනීමට එය බාධාවක් වී තිබුණි.

6.2 මානව සම්පත් සංවර්ධන සැලැස්ම

2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018, 6.1 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු විය යුතු වුවද, එසේ පුහුණු සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර නොතිබුණි.

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තු කාර්යසාධන දර්ශක

දර්ශකය	2023 වර්ෂයේ ඉලක්ක	සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස
• වර්ෂය තුළ ඉදිරිපත් වන නඩු භාණ්ඩ/සාම්පල/පරීක්ෂණ විශ්ලේෂණය කර වාර්තා නිකුත් කර අවසන් කිරීම.	90%	87%
• පෙර වර්ෂ වල ලැබුණු විශ්ලේෂණය සඳහා තවදුරටත් ඉතිරිව ඇති නඩු භාණ්ඩ/සාම්පල/පරීක්ෂණ වලට අදාල විශ්ලේෂණ වාර්තා ප්‍රවර්තන වර්ෂය තුළ නිකුත් කර අවසන් කිරීම.	100%	59%
• විද්‍යාගාර 02ක් නවීකරණය කිරීම.	70%	40%
• මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව ධාරිතා සංවර්ධනය	100%	70%

05 පරිච්ඡේදය

සුහුරු සංවර්ධන ඉලක්ක

තිරසාර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම පිළිබඳ ප්‍රගතිය

අරමුණ	ඉලක්කය	ලඟා කර ගැනීමේ දර්ශක	නිවැරදි දිනට ලඟාකර ගැනීමේ ප්‍රගතිය
සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතන 2030 වර්ෂය වන විට නීතිය හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා නඩු භාණ්ඩ විශ්ලේෂණයෙන් අනතුරුව නිකුත් කරන විද්‍යාත්මක වාර්තා මාස 03ක කාලයක් තුල ලබාදීමට කටයුතු කිරීම.	තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුලත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායී, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම.	• වර්ෂය තුළ ඉදිරිපත් වන නඩු භාණ්ඩ/ සාම්පල/පරීක්ෂණ විශ්ලේෂණය කර වාර්තා නිකුත් කර අවසන් කිරීම.	87%
		• පෙර වර්ෂ වල ලැබුණු විශ්ලේෂණය සඳහා තවදුරටත් ඉතිරිව ඇති නඩු භාණ්ඩ/සාම්පල /පරීක්ෂණ වලට අදාල විශ්ලේෂණ වාර්තා ප්‍රවර්තන වර්ෂය තුළ නිකුත් කර අවසන් කිරීම.	59%
		• අපරාධ ස්ථාන පරීක්ෂාවට අදාල වාර්තා නියමිත කාලය තුළ නිකුත් කිරීම.	100%
		• විද්‍යාගාර 02ක් නවීකරණය කිරීම.	40%
		• මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව ධාරිතා සංවර්ධනය	70%

06 පරිච්ඡේදය

මානව සම්පත් කළමනාකරණය හා පරිපාලනය

1.1 කාර්ය මණ්ඩල කළමනාකරණය

සේවක කාණ්ඩ මට්ටම	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	125	90
තෘතීය මට්ටම	10	3
ද්විතීය මට්ටම	131	80
ප්‍රාථමික මට්ටම	84	59
එකතුව	**350**	**232**

1.2 කාර්ය මණ්ඩල ඌණතා හා අතිරික්ත

	තනතුර	සේවය	ශ්‍රේණිය	ඩැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව			දැනට සිටින සේවක සංඛ්‍යාව				පුරප්පාඩු
					ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	වෙනත් (වැඩි බලන)	
1	ආණ්ඩුවේ රස පරීක්ෂක	SLSS	Sp.	SL 3	1	-	-	1	-	-	-	0
2	ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක	SLSS	Sp.	SL 3	2	-	-	2	-	-	-	0
3	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක	SLSS	Sp.	SL 3	1	-	-	1	-	-	0	0
4	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක	SLSS	I	SL 1	8	-	-	4	-	-	4	4
5	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක	SLSS	I	SL 1	2	-	-	2	-	-	0	0
6	අධ්‍යක්ෂ (පරිපාලන) ශ්‍රී.ල.ප.සේ.1 පන්තිය	SLAS	I	SL 1	1	-	-	0	-	-	1	1
7	ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ.1 පන්තිය	SLAcS	I	SL 1	1	-	-	1	-	-	-	0
8	අභ්‍යන්තර විගණක	SLAcS	II/III	SL 1	1	-	-	0	-	-	-	1
9	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක/සහකාර රස පරීක්ෂක	SLSS	II/III	SL 1	93	-	-	70	-	-	-	23
10	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ පරීක්ෂක/සහකාර පරීක්ෂක	SLSS	II/III	SL 1	14	-	-	9	-	-	-	5
11	ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ. 111 පන්තිය	SLAcS	II/III	SL 1	1	-	-	0	-	-	-	1
	ජ්‍යෙෂ්ඨ මට්ටම එකතුව				**125**	-	-	**90**	-	-	**5**	**35**
12	රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරී (අධි පන්තිය)	SLTS Supra	Sp.	MN -7	5	-	-	0	-	-	-	5
13	පරිපාලන නිලධාරී	PMAS Supra	Sp.	MN -7	1	-	-	1	-	-	-	0
14	භාෂා පරිවර්තක සේවය	TS	III	MN -6	2	-	-	2	-	-	-	0
15	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී (2 පන්තියේ 11/1 ශ්‍රේණිය)	SLICTS	II	MN -6	2	-	-	0	-	-	-	2
	තෘතීය මට්ටම එකතුව				**10**	**0**	**0**	**3**	**0**	**0**	**0**	**7**
16	පර්යේෂණ නිලධාරී	Dept	I/II/III	MN -4	1	-	-	1	-	-	-	0
17	සංවර්ධන නිලධාරී	DOS	I/II/III	MN -4	22	-	-	7	-	-	-	15

18	පුස්තකාලයාධිපති	SLGLS	I/II/III	MN -3	1	-	-	0	-	-	-	1
19	රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරී	Dept	I/II/III	MN -3	50	-	-	39	-	-	-	11
20	කාර්මික නිලධාරී	Dept	I/II/III	MN -3	1	-	-	0	-	-	-	1
21	කළමනාකරණ සේවා නිලධාරී	MSO	I/II/III	MN -2	36	-	-	24	-	-	-	12
22	යතුරු ලේඛක	Dept	I/II/III	MN -2	10	-	-	5	-	-	-	5
23	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන සහකාර	SLICTS	I/II/III	MT-1	10	-	-	4	-	-	-	6
	ද්විතීය මට්ටම එකතුව				**131**	**0**	**0**	**80**	**0**	**0**	**0**	**51**
25	රියදුරු සේවය	DS	Sp/I/II/III	PL-3	21	-	-	15	-	-	-	6
26	රසායනාගාර සහායක	Dept	I/II/III	PL-2	12	-	-	2	-	-	-	10
27	ගොඩනැගිලි නඩත්තු සහායක	Dept	I/II/III	PL-2	2	-	-	0	-	-	-	2
28	පුස්තකාල සහායක	Dept	I/II/III	PL-2	1	-	-	1	-	-	-	0
29	කාර්යාල සේවක සේවය	OES	Sp/I/II/III	PL-1	38	-	-	31	-	-	-	7
30	විද්‍යාගාර ඕඩර්ලි	Dept	I/II/III	PL-1	10	-	-	10	-	-	-	0
	ප්‍රාථමික මට්ටම එකතුව				**84**	**0**	**0**	**59**	**0**	**0**	**0**	**25**
	මුළු එකතුව				**350**	**0**	**0**	**232**	**0**	**0**	**5**	**118**

1.3 මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු

නිලධාරියාගේ නම	තනතුර	පැවැත්වූ දිනය	පාඨමාලාව
1.එස්.ඒ.එච්.ජේ. කුමාර මයා	රියදුරු	2023.02.28	Workshop on Driver Training Programme
2.එච්.ඩී.එම්.එම්. හපුආරච්චි මයා			
3.කේ.ඒ.ඩී.ටී.සම්පත් මයා			
4.ඩී.ඩබ්. සමරක්කොඩි මයා			
5.එස්.ඩී.ඩබ්.කේ. ඒකනායක මයා			
1.එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා මිය	**නියෝජ්‍ය රස පරීක්ෂක**	2023.10.30 -2023.03.11	General Conduct and Desciplinary Procedure - SLIDA
2. එල්.එස්. හතුරුසිංහ මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		
3. කේ.ඒ.ඩී.සී. කොඩිතුවක්කු මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		
4. පී.ජේ.ද සිල්වා මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		
5. අයි.ජේ. අඹේපිටිය මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		
6. ඩබ්.ජී.ඩී. සේනාරත්න මිය	**කළමනාකරණ සේවා නිලධාරී**	2023.11.13 -2023.11.17	
7.එස්.කේ. කුඩච්චි මෙව්.	**කළමනාකරණ සේවා නිලධාරී**		
1.යූ.ජී.එස්.ටී. ගමගේ මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2023.12.13	Training Programme on Management and Performance Improvement
2.සී.එන්. කුලසේකර මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		
3.එච්.එන්.ඒ. පෙරේරා මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		
4.එන්.එන්. බර්නාඩ් මිය	සහකාර රස පරීක්ෂක		
1.එස්. එම්. ඩී. වී. මාලා මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2023.10.06	Training on statistical Analysis for Chemical LAboratories
2.ඒ. එස්. සපුතන්ත්‍රී මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		
3.කේ.වී.පී. සන්ජීවනී මිය	සහකාර රස පරීක්ෂක		
4.වයි.එච්. මදුරාවල මිය	සහකාර රස පරීක්ෂක		
5.ජී.ඩී. එන්. එච්. ගුණරත්න	සහකාර රස පරීක්ෂක		
1.දීපිකා සෙනෙවිරත්න මිය	රස පරීක්ෂක	2023.10.09 – 2023.10.10	Leadership and Management Training
2.ජේ.එම්.ආර්. ජයසුන්දර මයා	සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක		
3.පී.එස්.කේ. රාජපක්ෂ මිය	අතිරේක රස පරීක්ෂක		
4.ඩී.ජේ. බණ්ඩාරනායක මිය	අතිරේක රස පරීක්ෂක		
5.පී.ජී. මඩවල මයා	නියෝජ්‍ය රස පරීක්ෂක		

6.කේ.පී. චන්ද්‍රානි මිය	නියෝජ්‍ය රස පරීක්ෂක		
7.කේ.කේ. අප්සරා මිය	සැක කටයුතු ලේඛණ පිළිබඳ නියෝජ්‍ය පරීක්ෂක		
8.ඩබ්.ඩී.වී.කරුණාරත්න මිය	නියෝජ්‍ය රස පරීක්ෂක		
9.එස්.පී. හපුතන්ත්‍රි මිය	නියෝජ්‍ය රස පරීක්ෂක		
10.එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා මිය	නියෝජ්‍ය රස පරීක්ෂක		
11.කේ.ඒ.පී. බන්දුමාලා මිය	නියෝජ්‍ය රස පරීක්ෂක		
12.කේ.එස්.අයි.කේ.කළුආරච්චි මයා	සැක කටයුතු ලේඛණ පිළිබඳ නියෝජ්‍ය පරීක්ෂක		
13. කේ.ඒ.ඩී.සී. කොඩිතුවක්කු මිය	නියෝජ්‍ය රස පරීක්ෂක		
14. කේ.වී. රත්නපාල මිය	නියෝජ්‍ය රස පරීක්ෂක		
1.වයි.එම්.ඩබ්.එස්.බණ්ඩාර මයා	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2023.03.27 – 2023.03.31	Course on Project Proposal Preparation - SLIDA
2.කේ.පී.ජී.කේ.ටී.ගුරුගේ මිය			
3.අයි.ජේ.අඹේපිටිය මිය			
4.එන්.අයි.කේ.ප්‍රනාන්දු මිය			
5.වී.එස්. ජයසේකර මිය			
6.යූ.එල්. කත්‍රිආරච්චි මිය			
7.සී.පී. කුමාරපේළි මිය			
8.එල්.එස්.හතුරුසිංහ මිය			
9.කේ.ඒ.ඩී.සී. කොඩිතුවක්කු මිය			
10.කේ.එස්.අයි.කේ.කළුආරච්චි මයා	සැක කටයුතු ලේඛණ පිළිබඳ නියෝජ්‍ය පරීක්ෂක		
11.වී.යූ. වීරරත්න මිය	සැක කටයුතු ලේඛණ පිළිබඳ ජ්‍යෙෂ්ඨ සහකාර පරීක්ෂක		
1.පී.ජී. මඩවල මයා	අතිරේක රස පරීක්ෂක	2023.12.07 – 2023.12.08	Developing Key performance Indicators for measuring performance - SLIDA
2.වී.ජේ. බණ්ඩාරණායක මිය	අතිරේක රස පරීක්ෂක		
3.ජේ.එම්.ආර්.ජයසුන්දර මයා	සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක		
4.කේ.කේ. අප්සරා මිය	සැක කටයුතු ලේඛණ පිළිබඳ නියෝජ්‍ය පරීක්ෂක		
5.පී.එස්.කේ.රාජපක්ෂ මිය	නියෝජ්‍ය රස පරීක්ෂක		
6.ඩබ්.ඩී.වී.කරුණාරත්න මිය	නියෝජ්‍ය රස පරීක්ෂක නි.ර.ප.		
7.එස්.පී. හපුතන්ත්‍රි මිය	නියෝජ්‍ය රස පරීක්ෂක.ර.ප.		
8.එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා මිය	නියෝජ්‍ය රස පරීක්ෂක		
9.කේ.ඒ.පී. බන්දුමාලා මිය	නියෝජ්‍ය රස පරීක්ෂක		
10.ඩබ්.ඒ.ආර්. ප්‍රනාන්දු මයා	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		
11.කේ.එස්.අයි.කේ.කළුආරච්චි මයා	සැක කටයුතු ලේඛණ පිළිබඳ නියෝජ්‍ය පරීක්ෂක		
12.පී.එස්. ලියනගේ මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		

විදේශීය පුහුණු

නිලධාරියාගේ නම	තනතුර	කාල සීමාව	පුහුණුව
1.ඩබ්.ඒ.ආර්.ප්‍රනාන්දු මයා	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2023.02.06 – 2023.02.10	Existing Technologies to aid a Nuclear Forensic Investigation - Colombo
2.එන්.අයි.කේ.ප්‍රනාන්දු මයා	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		
3.එල්.ඒ.ඩබ්.කේ.දහනායක මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		
4.ඩබ්.පී.ඒ.ආර්.ඩී. බණ්ඩාර මයා	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		
5.ඩී.එම්.ජී.සී. බණ්ඩාර මයා	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		
6.පී.ජී.එස්. චතුරංග මයා	සහකාර රස පරීක්ෂක		
7.එන්.කේ.සී.සේනාරත්න මිය	සහකාර රස පරීක්ෂක		
1.එස්.එල්.ආර්. ගුණවර්ධන මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2023.02.21 – 2024.08.31	Master's in Forensic Science 2023-2024 KOICA
2.ටී.ආර්.එම්.සී.ඩී. මැණිකේ මිය			
3.එච්.ටී.ටී. ප්‍රියදර්ශනී මිය			
4.පී.ජී.පී.චන්ද්‍රසිරි මයා			
5.එල්.ආර්.ටී. පෙරේරා මිය			
6.ඒ.ඩී.එස්.රත්නකුමාර මයා			
7.සී.කේ. බණ්ඩාර මයා			
8.යූ.එස්. ප්‍රේමතිලක මිය			
1.කේ.එස්.අයි.කේ.කළුආරච්චි මයා	සැක කටයුතු ලේඛණ පිළිබඳ නියෝජ්‍ය පරීක්ෂක	2023.03.07 – 2023.03.17	US Project: Ink Analysis – (Online Training)
2.ටී.යූ. වීරරත්න මිය	සැක කටයුතු ලේඛණ පිළිබඳ ජ්‍යෙෂ්ඨ සහකාර පරීක්ෂක		
3.ඩබ්.ඒ.අයි.ඩී. ප්‍රේමවන්ද්‍ර මිය	සැක කටයුතු ලේඛණ පිළිබඳ ජ්‍යෙෂ්ඨ සහකාර පරීක්ෂක		
4.බී.එස්.එම්.ජිෂාන් මයා	සැක කටයුතු ලේඛණ පිළිබඳ සහකාර පරීක්ෂක		
5.කේ.පී. සිරිවර්ධන මයා	සැක කටයුතු ලේඛණ පිළිබඳ ජ්‍යෙෂ්ඨ සහකාර පරීක්ෂක		
1.එච්.එන්.ඒ.පෙරේරා මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2023.03.20 - 2023.03.24	Emerging Trends in illicit Synthetic Drugs (In Colombo)
2.එන්.එන්.බර්නාඩ් මිය			

ITEC – Schlarship Schemes – India – In person

නිලධාරියාගේ නම	තනතුර	කාල සීමාව	සම්මන්ත්‍රණය
1.ඩබ්.ඒ.අයි.ඩී. ප්‍රේමවන්ද්‍ර මිය	සැක කටයුතු ලේඛණ පිළිබඳ ජ්‍යෙෂ්ඨ සහකාර පරීක්ෂක	2023.02.06 - 2023.02.24	International Training Programme on Competence on Laboratories and their Management Systems
2.අයි.ජේ.අඹේපිටිය මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2023.02.01 – 2023.02.14	The Biosecurity Continuum & Trade – Tools for the Pre-Border, Border & Post Border Bio Securiy
3.ඊ.එම්.ඩී.ටී.ඊ. උඩංගමුව මයා	සැක කටයුතු ලේඛණ පිළිබඳ සහකාර පරීක්ෂක	2023.02.20 – 2023.03.11	(ITEC) – Leading Cyber Security Change – Building a Security Basd Culture
4.කේ.එස්.එන්.සඳගිරි මයා	සැක කටයුතු ලේඛණ පිළිබඳ ජ්‍යෙෂ්ඨ සහකාර පරීක්ෂක	2023.02.13 – 2023.03.24	(ITEC) – Specialized Programme on Reducing Cyber Crime through Knowledge Exchange & Capacity

			Building
5.එම්.එම්.ජී. ජයසිංහ මයා	තොස.හා තාස.	2023.03.20 – 2023.03.24	Emerging Technologies – Internet of Things
6.කේ.ඩී.ඩබ්.පංචමී මිය	ජ්‍යෙ. සහ. රස පරී.	2023.10.10-18	Specilaized Training Programmme on Standarads" Regulations and WTO, SPS and TBT Measures
7.පී.පී. මලලසේකර මිය	සහ. රස පරී.	2023.09.18 – 2023.09.29	Chemical Analysis of Narcotic Drug & Psychotropic Substance and Precursor Chemicals
8.ඩබ්.එස්.එච්.කේ. ජයවංශ මිය	ජ්‍යෙ. සහ. රස පරී.	2023.11.20 – 2023.12.08	International Training Programme on Conformity Chemicals.

KOICA Fellowship Training Training Programme in Korea

(CIAT) Phase 2 – A Physical Forensic, Accident Analysis, Ballistic, Arson Analysis.

නිලධාරියාගේ නම	තනතුර	කාල සීමාව
1.ඩබ්.ඒ.ආර්. ප්‍රනාන්දු මයා	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	දකුණු කොරියාව 2023.10.08 -2023.10.24
2.වයි.එම්.ඩබ්.එස්.බණ්ඩාර මයා		
3.එන්.අයි.කේ.ප්‍රනාන්දු මිය		
4.අයි.එච්. කුලතුංග මිය		
5.ඩී.එම්.ජී.සී. බණ්ඩාර මයා		
6.ඩබ්.එම්.ඒ. කුමාර මයා		
7.ඩබ්.ඒ.එච්.සංජය මයා		
8.ඒ.සී.එස්. ධර්මරත්න මිය	සහකාර රස පරීක්ෂක	
9.ඩබ්.පී.ඒ.ආර්.ඩී. බණ්ඩාර මයා		
10.ආර්.එම්.එල්.එස්. රත්නායක මිය		
11.එම්.කේ.සී.සේනාරත්න මයා	සහකාර රස පරීක්ෂක	
12.කේ.එම්.ඩී.එස්. සුබසිල මිය		
13.ටී.එම්.වී. දේශාන් මයා		
14.සී.ඩී. පරණගම මයා		
15.එම්.එම්.එස්. ප්‍රේමලාල් මයා	විමර්ශන නිලධාරී	

KOICA Highlevel Officicals Invitational Training Programme – Strengthen Capacity Building of Forensic Drug Analysis in the Criminal Justice System in Sri Lanka

නිලධාරියාගේ නම	තනතුර	කාල සීමාව
1.දීපිකා සෙනෙවිරත්න මිය	ආණ්ඩුවේ රස පරීක්ෂක	දකුණු කොරියාව 2023.05.20 – 2023.05.31
2.පී.එස්.කේ.රාජපක්ෂ මිය	නියෝජ්‍ය රස පරීක්ෂක	
3.ඩබ්.ඩී.වී. කරුණාරත්න මිය	නියෝජ්‍ය රස පරීක්ෂක	

UNODC Global Maritime Crime Programme - Colombo

නිලධාරියාගේ නම	තනතුර	කාල සීමාව
1.පී.ජී. ද සිල්වා මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	කොළඹ 2023.07.18 -2023.07.21
2.ඒ.එස්. සපුතන්ත්‍රි මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	

Training of safe handling of Synthetic Opioids, use of Raman Drug testing device and Drug and Precursor Identification kits – UNODC

නිලධාරියාගේ නම	තනතුර	කාල සීමාව
1.කේ.ඒ.ඩී.සී. කොඩිතුවක්කු මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	ඔස්ට්‍රියා - වියානා 2023.12.04 – 2023.12.08
2.කේ.වී.රත්නපාල මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	
3.යූ.එල්. කත්‍රිආරච්චි මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	
4.වී.එස්.ජයසේකර මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	

MSc. In Forensic Science in United Kingdom (Treasury Funds)

නිලධාරියාගේ නම	**තනතුර**	**කාල සීමාව**
1.ඊ. මාරසිංහ මිය	**ජ්‍යෙ. සහ. රස පරී.**	එක්සත් රාජධානිය 2023.09.11 – 2024.09.11

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාල අවශ්‍යතාවය	අනුකූලතා තත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
1	නියමිත දිනයට මූල්‍ය ප්‍රකාශන/ගිණුම් ඉදිරිපත් කර තිබුණේ?			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	ඔව්		
1.2	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම	ඔව්		
1.3	වෙළඳ සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නැත		
1.6	වෙනත් - පොදු තැන්පත් ගිණුම	ඔව්		
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම			
2.1	2018.11.21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය	ඔව්		
2.2	පුද්ගල පඩි නඩි ලේඛනය/පුද්ගල පඩි නඩි කාඩ්පත්	ඔව්		
2.3	විගණන විමසුම් ලේඛනය	ඔව්		
2.4	අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය	ඔව්		
2.5	සිගාස් පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කර මාසික ගිණුම් සාරාංශ පිලියෙල කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන්නේද?	ඔව්		
2.6	ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය	ඔව්		
2.7	බඩු ලේඛන පොත	ඔව්		
2.8	තොග පොත	ඔව්		
2.9	හානි පිළිබඳ ලේඛනය	ඔව්		
2.10	බැරකම් ලේඛනය	ඔව්		
2.11	චෙක්පත් උප පත්‍රිකා ලේඛනය	ඔව්		
3	මූල්‍ය බලතල පැවරීම			
3.1	මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදුකර තිබේද?	ඔව්		
3.2	මූල්‍ය බලතල පැවරීම ආයතනය තුළ සන්නිවේදනය කර තිබේද?	ඔව්		
3.3	එම මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා තිබුණේද?	ඔව්		
3.4	2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන් විසින් පහත සඳහන් පාලන ක්‍රම අනුගමනය කර තිබේද?	ඔව්		
4	වාර්ෂික සැලසුම් පිලියෙළ කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙළ කර තිබුණේද?	ඔව්		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිලියෙළ කර තිබුණේද?	ඔව්		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබේද?	ඔව්		
4.4	ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර තිබේද?	ඔව්		
4.5	වර්ෂය ආරම්භයේදී එක් එක් මාසයට අදාළව අවශ්‍ය වන මුදල් අවශ්‍යතාවය ඇතුළත් මුදල් ප්‍රවාහය සැලසුම් කර එය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළේද?	ඔව්		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති සියළුම විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළදී පිළිතුරු ඉදිරිපත් කර තිබේද?/විගණන විමසුම් නොතිබුණේද?	අදාල නැත		

6	අභ්‍යන්තර විගණනය			
6.1	සියළුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළතදී පිළිතුරු ඉදිරිපත් කර තිබුණේද? අභ්‍යන්තර විගණන විමසුම් නොතිබුණේද?	ඔව්		
6.2	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන්නේද? එවැනි වාර්තා නොතිබුණේද?	ඔව්		
6.3	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන්නේද? එවැනි වාර්තා නොතිබුණේද?	ඔව්		
6.4	මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කරන ලද්දේද?	අදාල නැත		
7	විගණන හා කළමනාකරණ කමිටුව			
7.1	විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් අවම වශයෙන් වර්ෂයකට 04ක් හෝ පවත්වා තිබුණේද? සහභාගී වී තිබුණේද?	අමතාංශයේ පැවැති රැස්වීම් 03ක් සඳහා සම්බන්ධ වී ඇත.		
8	වත්කම් කළමනාකරණය			
8.1	2017.07.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාල වෙත ඉදිරිපත් කරන ලද්දේද?	ඔව්		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත් කර ඒ බව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට දන්වා යවන ලද්දේද?	ඔව්		
8.3	2016.03.31 දිනැති අංක 05/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළේද?	ඔව්		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාල වකවානු තුළ සිදුකර තිබුණේද? එවැනි දෝෂ සිදුකර තිබුණේද? එවැනි දෝෂ සිදුවී නොතිබුණේද?	ඔව්		
8.5	මු.රෙ 772 අනුව අබලි ද්‍රව්‍ය අපහරණය කර තිබේද?	ඔව්		
9	වාහන පාලනය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන්නේද?	ඔව්		
9.2	වාහනයක් ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයකදී අපහරණය කරනු ලබන්නේද? එවැනි වාහන නොතිබුණේද?	ඔව්		
9.3	සෑම වාහනයක් සඳහාම වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර තිබේද?	ඔව්		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර තිබේද? එසේ අනතුරු සිදුවී නොතිබුණේද?	ඔව්		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර තිබේද?	ඔව්		
9.6	ලීසිං වාරික ගෙවා අවසන් වාහන වල පරම අයිතිය පවරාගෙන තිබුණේද?	ඔව්		
10	බැංකු ගිණුම් ප්‍රකාශය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා සූදානම් කර තිබුණේද?	ඔව්		

10.2	සමාලෝචන වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට පැවත එමින් තිබුණු අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කළේද? එවැනි ගිණුම් නොතිබුණේද?	ඔව්		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබුණු ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව කටයුතු කර එම ශේෂ මාසයක් ඇතුලත නිරවුල් කර තිබුණේද?/එවැනි ගැලපුම් නොතිබුණේද?	ඔව්		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	වැය විෂයකට හෝ ව්‍යාපෘතියකට හෝ වැඩසටහනකට හෝ ශීර්ෂයකට සලසා තිබුණු ප්‍රතිපාදන සීමාව නොඉක්මවා වියදම් කර තිබුණේද?	ඔව්		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණේද? එවැනි බැරකම් වලට එළඹ නොතිබුණේද?	ඔව්		
12	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම			
12.1	අදාළ අත්තිකාරම් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් පිළිපැද තිබුණේද? /පාර්ලිමේන්තුව විසින් අත්තිකාරම් කාර්යයක් පවරා තිබුණේද?	ඔව්		
12.2	හිඟහිටි ණය ශේෂ වල කාල විශ්ලේෂණයක් පිළියෙළ කර තිබුණේද? එවැනි ශේෂ නොතිබුණේද?	ඔව්		
12.3	වර්ෂ 1කට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබුණේද? එවැනි හිඟහිටි ශේෂ නොතිබුණේද?	නැත	• රු.18,754/- ක ණය ශේෂය නඩු තීන්දුවෙන් පසුව නිරවුල් කරනු ඇත. • රු. 4,800/- ක ණය ශේෂයන් සඳහා ගෙවීම් කරන ලෙස අදාල නිලධාරීන්ට දන්වා ඇත.	
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබුණේද? එවැනි තැන්පතු නොතිබුණේද?	ඔව්		
13.2	පොදු තැන්පත් ලේඛනය නඩත්තු කරමින් පවතීද?	ඔව්		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළේද?	ඔව්		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කළේද? එසේ අග්‍රිම නිකුත් නොකළේද?	ඔව්		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබුණේද?	ඔව්		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ සසඳා අනාවරණය වූ වෙනස්කම් මාසිකව සසඳා තිබුණේද?	ඔව්		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ විධිවිධාන වලට අනුකූලව රැස්කළ ආදායම් ආපසු ගෙවා තිබුණේද?/ එසේ ආදායම් ආපසු ගෙවා නොතිබුණේද?	ඔව්		
15.2	රැස්කර තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැරකර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැරකර හෝ තිබුණේද? එවැනි ආදායම් නොතිබුණේද?	ඔව්		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් පිළිබඳ තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබේද?	ඔව්		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩලය අනුයුක්ත කර/බඳවා ගෙන තිබේද?	නැත		
16.2	කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත ලිඛිත කාර්යය පැවරුම් කර තිබේද?	ඔව්		
16.3	2017.09.20 දිනැති අංක 04/2017 දරණ කළමනාකරණ සේවා චක්‍ර			

	ලේඛය ප්‍රකාරව ආයතනයේ නිළධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැර යෑම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැන්වීම් හා මිය යාම් වැනි කරුණු හේතුවෙන් සිදුවන කාර්යය මණ්ඩලය වෙනස් වීම් අනුව යාවත්කාලීන කරන ලද කාර්යය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණේද?	ඔව්		
17	මහජනයා වෙත තොරතුරු ලබාදීම			
17.1	තොරතුරු දැනගැනීමේ පනත පනත ප්‍රකාරව මහජනයා වෙත අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවට අදාළ තොරතුරු ලබාදීම සඳහා වගකිව යුතු නිලධාරියෙක් පත්කර තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා තිබේද?	ඔව්		
17.2	මහජනයා විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගැනීම, ලේඛන ගත කිරීමට ඒම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය දැක්වෙන ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා තිබේද?	ඔව්		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන ඡේද වලට අනුකූලව අර්ධ වාර් ෂිකව හා වාර් ෂිකව වාර්තා ඉදිරිපත් කර තිබේද?	ඔව්		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	2018.01.24 දිනැති අංක 05/2018 (1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයෙන් හඳුන්වා දී ඇති පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව අමාත්‍යාංශ/දෙපාර්තමේන්ත්ව විසින් පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය පිලියෙල කර ඒය ක්‍රියාත්මක කර තිබේද?	ඔව්		
18.2	චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිලියෙල කිරීම සහ ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය සහ ඇගයීම සඳහා අමාත්‍යාංශය/දෙපාර් තමේන්තුව විසින් ඒ් සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද?	ඔව්		
19	මානව සම්පත් සැලැස්ම පිලියෙල කිරීම			
19.1	2018.01.24 දිනැති අංක 02/2008 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර තිබේද?	ඔව්	-	
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ සහතික කර තිබේද?	ඔව්		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පදනම් කර ගෙන සමස්ථ කාර්යය මණ්ඩලය සඳහාම වාර් ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබේද?	නැත	කාර්ය සාධන ගිවිසුම සකස් කරමින් පවතී.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කරන ලද්දේද?	ඔව්		
20	විගණන ඡේද			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත්කළ විගණන ඡේද වලින් පෙන්වා දී තිබුණු අඩුපාඩු නිවැරදි කර තිබුණේද? ඒවැනි විගණන ඡේද නොතිබුණේද?	ඔව්		